# ශාස්ත්‍රවේදී බාහිර උපාධි පාඨමාලා විවරණිකාව - 2020

# UNDERGRADUATE PROSPECTUS – 2020
# for
# BACHELOR OF ARTS (GENERAL) EXTERNAL DEGREES

## මානවශාස්ත්‍ර හා සමාජීයවිද්‍යා පීඨය
## ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය

# ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය
# University of Sri Jayewardenepura

**විශ්වවිද්‍යාලයීය ලාංඡනය - The Emblem of the University**

---

**විශ්වවිද්‍යාලයීය ආදර්ශ පාඨය - The Motto of the University**

**“විජ්ජා උප්පතතං සෙට්ඨා”**

---

**විශ්වවිද්‍යාලයීය දැක්ම - The Vision of the University**

අධ්‍යාපනයෙන් ජීවිත සෞභාග්‍යවත් කිරීම

---

**විශ්වවිද්‍යාලයීය මෙහෙවර - The Mission of the University**

අපගේ සංස්කෘතික උරුමයන්ගෙන් හා ඥානයන්ගෙන් ප්‍රබෝධයට පත් වෙමින් අධ්‍යාපනය ඇසුරෙන් තිරසර අනාගතයක් උදෙසා ගෝලීයව සාර්ථක පුරවැසියන් නිර්මාණය කිරීම

# ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයීය ගීතය
## Anthem of University of Sri Jayewardenepura

ශ්‍රී ලංකා පින්බර රන් දෙරණේ
ශ්‍රී නිවාස වූ මහ අගනගරේ
ශ්‍රී ජයවර්ධනපුර සරසවියේ
ශ්‍රී නාමය රඳවවු ලෝ මුදුනේ

හික්කඩුවේ සිරි සුමඟල් සමිඳුන්
වැලිවිටියේ සෝරත බඳු යතිඳුන්
බිහිකළ විද්‍යෝදය විදු බිම දුන්
එළියෙන් - දිවි මග සරසවු

අයුක්තියේ දී විවාදශීලී
අසත්‍යයේ දී විචාරශීලී
වියත් සබා මැද සමාජශීලී
වියතුන් වී දැය පොබයවු
විජ්ජා උප්පතතං සෙට්ඨා..//



**ගේය පද රචනය**
සේවාර්පිත මහාචාර්ය සුනිල් ආරියරත්න

**තනු නිර්මාණය සහ සංගීතය**
ආචාර්ය රෝහණ වීරසිංහ

# ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය
# ශාස්ත්‍රවේදී බාහිර උපාධි පාඨමාලා විවරණිකාව
# මානවශාස්ත්‍ර හා සමාජීයවිද්‍යා පීඨය

ISBN-978-955-9054-73-3

**සංස්කරණය**

පූජ්‍ය ආචාර්ය පින්නවල සංඝසුමන හිමි
මහාචාර්ය ආර්.එම්.කේ. රත්නායක
මහාචාර්ය කේ. ඒ. වීරසේන
මහාචාර්ය ඩබ්.ඒ.එස්. විජේකෝන්

**සෝදුපත් කියවීම**

ආචාර්ය ප්‍රණීත් අභයසුන්දර

**පිට කවරය**

යසිරු ද සිල්වා

**මුද්‍රණය**

සුමති ප්‍රින්ටර්ස්

උගත්, බුද්ධිමත්, විනයගරුක රටට වැඩදායී පුද්ගලයන් බිහි කිරීම සුවිශේෂී මෙහෙවර කරගත් ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය අද ශ්‍රී ලංකාවේ විශ්වවිද්‍යාල අතරින් සිසුන් සංඛ්‍යාව අතින් විශාලතම විශ්වවිද්‍යාලය බවට පත්ව ඇත. එවන් රාජ්‍ය විශ්වවිද්‍යාලයක සිසුවෙකුව, මානව සංහතියේ ප්‍රගමනය සඳහා දැනුමෙන් සන්නද්ධවීමට අපේක්ෂාවෙන් සිටින ඔබ වැනි උපාධි අපේක්ෂකයන්ට විශ්වවිද්‍යාලයේ උපකුලපති තුමා ලෙස පළමුව සුභපතමි. බෞද්ධ පිරිවෙනක් මුල්කරගෙන බිහිවූ ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය දේශීය සංස්කෘතියත්, දේශමාමකත්වයත්, නව ප්‍රවනතාත් එක්කරමින් ගෝලීයකරණය වෙතින් ලොව ජයගැනීමට හැකි දේශීය දැනුම ජනිත කිරීමේ සහ බෙදාදීමේ කේන්ද්‍රස්ථානයක් ලෙසට ලොව පුරා මහත් කීර්ති නාමයක් ඇතිකරගෙන ඇත්තේ අභ්‍යන්තර වුත් බාහිර වුත් උපාධිධරයන්ගේ සමාජ දායකත්වය නිසාවෙනි. ප්‍රෞඩ ඉතිහාසයක් ඇති ලෝකයේ ප්‍රසිද්ධ ආචාර්ය මහාචාර්යවරුන්ගේ පහස ලත් මානවශාස්ත්‍ර හා සමාජවිද්‍යා පීඨය මගින් ශාස්ත්‍රවේදී  (සාමාන්‍ය) බාහිර උපාධිය, සමාජීය විද්‍යාවේදී පාරිසරික හා සංවර්ධන අධ්‍යයන (සාමාන්‍ය) බාහිර උපාධිය හා ශාස්ත්‍රවේදී ඉංග්‍රීසී භාෂාව පිළිබඳ (සාමාන්‍ය) උපාධිය හැදෑරීමේ වරම් හිමි ඔබ සැම දුෂ්කර වුත්, අභියෝගාත්මක වුත් තුන් වසරක කාලයක් අඛණ්ඩ අධ්‍යාපන චර්යාවක නියුතු විය යුතු වන්නේ උපාධියක් ලබාගැනීම පහසු කාර්යයක් නොවන නිසාවෙනි. ප්‍රතිපෝෂණ සම්මන්ත්‍රණ තුළින් කීර්තිමත් ආචාර්ය මහාචාර්යවරුන්ගේ දේශන සඳහා සහභාගීවීමේ වරම් ඔබට හිමිකරදෙනු ලබනුයේ උපාධිධරයෙකු තුළ පැවැතිය යුතු සංවිධිත වුත් ස්ථිර වුත් දැනුම වර්ධනය කරගැනීම සඳහාය. ඒ සදහා වීඩියෝ තාක්ෂණය උපයෝගී කර ගනිමින් අන්තර්ජාලය ඔස්සේ අධ්‍යයන කටයුතු කරගෙන යෑමට අවශ්‍ය පහසුකම් සලසා දීම ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය ගත් තවත් සුවිශේෂී පියවරකි.

බාහිර සිසුවෙකු වශයෙන් ලියාපදිංචි වන ඔබට කීර්තිමත් විශ්වවිද්‍යාලයක සැබෑ සාමාජිකත්වය ලබාගැනීමට වරම් හිමිවනුයේ වසර තුනක් අවසන ලබාගන්නා උපාධියෙනි. අභ්‍යන්තර ශිෂ්‍යයකු විශ්වවිද්‍යාලයට වැදගත් වන්නේ යම්සේ ද බාහිර උපාධි අපේක්ෂකයකු ලෙස ඔබ ද විශ්වවිද්‍යාලයට ඉතා වැදගත් වේ. එබැවින් මහත් කැපවීමෙන් හා ධෛර්යයෙන් යුතුව ඉදිරි වසර තුනක කාලය අධ්‍යාපනය සඳහා කැපකිරීමටත් එහි සාර්ථක ප්‍රතිඵල ලබාගැනීමටත් ඔබ සමත්විය යුතු වේ. ඒ සඳහා ශක්තිය හා ධෛර්යය ලැබේවායි ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ උපකුලපති වශයෙන් ශුභාශිංසන එක්කරමි.



ජ්‍යෙෂ්ඨ මහාචාර්ය සුදන්ත ලියනගේ
උපකුලපති



මහාචාර්ය එස්.සී.බී. හීන්කෙන්ද
පීඨාධිපති,
මානවශාස්ත්‍ර හා සමාජීයවිද්‍යා පීඨය

නිදහස් ශ්‍රී ලංකාවේ පළමු විශ්වවිද්‍යාලය වන ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය විශ්වවිද්‍යාල පද්ධතියට බාහිර උපාධි පාඨමාලාවන් හඳුන්වාදුන් විශ්වවිද්‍යාලයයි. එහි විද්‍යාර්ථියකු වෙමින් ඔබ ලබන අභිමානයට මම සුබාශිංශන එක් කරමි. ලංකාවේ අධ්‍යාපන පද්ධතිය තුළ විශ්වවිද්‍යාල පද්ධතියට පිවිස උසස් අධ්‍යාපනයේ නිරතවීමට අවස්ථාව උදාවන්නේ සු!ළු පිරිසකට වන අතර එයිනිදු ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයීය විද්‍යාර්ථියකු වීමට අවස්ථාව උදාවීම ම උසස් අධ්‍යාපනයේ නිරතවන ශ්‍රී ලාංකිකයකු ලබන විශේෂ උදානයකි. එම අවස්ථාව උදා කරගැනීමේ භාග්‍ය ලද ඔබ ශ්‍රී ජයවර්ධනපුර නාමය නිසි පරිදි සමාජගත කිරීමේ වගකීම ඉටු කරනු ඇත. එමෙන්ම සමාජ පද්ධතියට අවශ්‍ය මානවශාස්ත්‍ර හා සමාජීයවිද්‍යා කෙෂ්ත්‍රවල පවතින ආවශ්‍යතාවන් සම්පූර්ණ කර උගත් බුද්ධිමත් මානව හිතවාදී මතු පරපුරකට අවශ්‍ය මගපෙන්වීම මානවශාස්ත්‍ර හා සමාජීයවිද්‍යා පීඨය වශයෙන් අප උර මත ඇති මෙහෙවරයි.

එම මෙහෙවර සාක්ෂාත් කරනු වස් ඔබට ලබා දෙන මෙම අමිල අවස්ථාව සුවහසක් ශ්‍රී ලාංකික දරු පරපුරට ඔවුනගේ ජීවිතයේ සිහින යථාර්ථයට මහගු පිටිවහලක් වනු ඇත. එබැවින් ශාස්ත්‍රවේදී ඉංග්‍රීසි (සාමාන්‍ය) බාහිර හෝ සමාජීය විද්‍යාවේදී පාරිසරික හා සංවර්ධන අධ්‍යයන (සාමාන්‍ය) බාහිර උපාධි අපේක්ෂක අපේක්ෂිකාවක වශයෙන් ඔබ ලද මෙම මහාර්ඝ අවස්ථාව කාර්යක්ෂමවත් සඵලදායීවත් භාවිතයට ගෙන අනාගත පරපුරටද එහි අවස්ථාවන් ලබාගැනීමේ ධනාත්මක උත්තේජනයන් සපයමින් යහ පුරවැසියෙකු වශයෙන් සමාජගත වීමට අවැසි අධ්‍යයන පරිසරය ඔබට දායාද කිරීම අපගේ ඒකායන අරමුණ වනු ඇත. මෙය එහි එක් අවස්ථාවක් පමණි.

විශ්වවිද්‍යාලයීය අභ්‍යන්තර විද්‍යාර්ථියකු වීමට ඔබට පැවති අවස්ථාව වියැකී ගියද බාහිර විද්‍යාර්ථියකු වශයෙන් වුවද ඔබ ඔබගේ මතු දියුණුව අරමුණු කරගනිමින් මෙම අවස්ථාවෙන් නිසි ඵල ලබනු ඇතැයි අප උදක්ම අපේක්ෂා කරන අතර එයින් ශ්‍රී ජයවර්ධනපුර සන්නාමය බැබළවීමට ඔබට දායකවීමට හැකි වේවායි මා

උසස් පෙළ සමත් වුවත් අභ්‍යන්තර ශිෂ්‍යයෙකු ලෙස විශ්වවිද්‍යාල අධ්‍යාපනය ලැබීමට තිබූ අවස්ථාව අහිමිවීමෙන් බොඳවූ ඔබේ සිහිනය නැවත සැබෑකර ගැනීමට ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ මානවශාස්ත්‍ර හා සමාජීයවිද්‍යා පීඨය මගින් පවත්වාගෙන යන බාහිර උපාධි පාඨමාලා මගින් දොරටු ඔබට විවර වී තිබේ. ඔබට විවර වී තිබේ. බාහිර උපාධි අපේක්ෂකයන් ස!දහා මානවශාස්ත්‍ර හා සමාජීයවිද්‍යා පීඨය ම!ගින් මෙතෙක් පවත්වාගෙන ගිය ශාස්ත්‍රවේදී උපාධියට අමතරව ශාස්ත්‍රවේදී පාරිසරික හා සංවර්ධන අධ්‍යයන සහ ඉංග්‍රීසි ආදී වශයෙන් විවිධ විෂය ධාරාවන්ගෙන් සමන්විත උපාධි පාඨමාලා හැදෑරීමට දැන් ඔබට අවස්ථාවක් උදාවී තිබේ. සේවා නියුක්ත කළ හැකි ආකාරයට සමාජයට වැඩදායී උපාධිධාරීන් බිහිකිරීම විසි එක් වන සියවසේ විශ්වවිද්‍යාල මුහුණ දී සිටින ප්‍රධාන අභියෝගය වේ. මේ අභියෝගයට සාර්ථකව මුහුණදීම පිණිස උපාධි පාඨමාලාවල අදාළත්වය හා ගුණත්වය ඉහළ නැංවීම සඳහා විශ්වවිද්‍යාල අධ්‍යාපනයේ වෙනස්කම් රැසක් මෑතක දී සිදුකර තිබේ. ඒ අනුව යමින් බාහිර උපාධි පාඨමාලාවල සිදුකරන ලද ප්‍රතිසංස්කරණ මේ වනවිට ක්‍රියාත්මක වෙමින් පවතී. එහි ප්‍රතිඵලයක් වශයෙන් පැවති බාහිර උපාධි පාඨමාලා නූතන සමාජයට ගැලපෙන ලෙස ප්‍රතිසංවිධානය කර ඇත. එලෙස බිහිවූ නව උපාධි පාඨමාලාවක් හැදෑරීමට ඔබට අවස්ථාව උදාවී තිබේ.




ජ්‍යෙෂ්ඨ මහාචාර්ය ඊ. දයාරත්න
අධ්‍යක්ෂ
බාහිර උපාධි හා විස්තාරිත පාඨමාලා ඒකකය

බාහිර උපාධි හා විස්තාරිත පාඨමාලා ඒකකය බිහිවන්නේත් ඒ ප්‍රතිසංස්කරණ යටතේ ය. බාහිර උපාධි අපේක්ෂකයන් වෙනුවෙන් විශ්වවිද්‍යාලය තුළ ක්‍රියාත්මක වන එකම ආයතනය වන්නේ බාහිර උපාධි හා විස්තාරිත පාඨමාලා ඒකකයයි. බාහිර උපාධිය සඳහා ලියාපදිංචිවීමේ සිට උපාධි ප්‍රදානෝත්සවය දක්වා ඇති සියලුම කාර්යයන් මෙහෙයවන්නේ මෙම ඒකකයෙනි. මෙතෙක් පැවති ගුරු කේන්ද්‍රීය අධ්‍යාපන ක්‍රමය වර්තමානය වන විට ශිෂ්‍ය කේන්ද්‍රීය අධ්‍යාපන ක්‍රමයක් බවට පරිවර්තනය වී තිබේ. මේ ක්‍රියාවලියේ දී සිසුන්ට අවශ්‍ය ම!ගපෙන්වීම හා සහයෝගය සපයනු ලබන්නේ බාහිර උපාධි හා විස්තාරිත පාඨමාලා ඒකකයෙනි.

වර්තමානයේ දිවයිනේ පවත්නා අයහපත් සෞඛ්‍ය වාතාවරණයට ද මුහුණ දෙමින් මෙම පාඨමාලා සාර්ථකව පවත්වාගෙන යාමට අවශ්‍ය කටයුතු බාහිර උපාධි හා විස්තාරිත පාඨමාලා ඒකකය මගින් සිදු කර තිබේ. ඒ යටතේ විද්‍යුත් ඉගෙනුම් පද්ධතිය හරහා වීඩියෝ දර්ශන පට ම!ගින් සහ මාර්ගගත ක්‍රමයට සජීවිව දේශන පැවැත්වීම ද සිසුන් කැඳවා පවත්වන දේශන තුළින් ද ඔබට අවශ්‍ය අධ්‍යාපන දැනුම ලබා දීමට අවශ්‍ය කටයුතු සම්පාදනය කර තිබේ.

අඩු වියදමකින්, කෙටි කාලයක් තුළ, රාජ්‍ය විශ්වවිද්‍යාලයකින් පිළිගත් උපාධියක් ලබාගැනීමට අවස්ථාව ඔබට උදා වී ඇත. ඔබේ කාර්යභාරය වන්නේ ඔබ තෝරාගන්නා උපාධි පාඨමාලාව සාර්ථකව කෙටි කලක් තුළ නිමවා එමගින් ලබාගත් දැනුම සමාජයේ ප්‍රගමනයටත් සංවර්ධනයටත් දායක කරලීම ය. ඒ සඳහා ඔබට ධෛර්යය හා ශක්තියත් වාසනාවත් ලැබේවා! යි ප්‍රාර්ථනය කරමි.

2020 වර්ෂයට අතුලත් වූ නවක උපාධි අපේක්ෂකයින් වෙනුවෙන් සකස් කරනු ලබන බාහිර උපාධි පාඨමාලා අත්පොත වෙනුවෙන් පණිවුඩයක් නිකුත් කිරීමට ලැබීම සතුටට කරුණකි.



කේ. ඥානසිරි බ්‍රිටෝ
ලේඛකාධිකාරී

මෙරට ජාතික විශ්වවිද්‍යාල අතර ප්‍රමුඛ ස්ථානයක් හිමිකරගෙන සිටින ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය බාහිර උපාධි පාඨමාලා ආරම්භ කළ විශ්වවිද්‍යාල අතර ද ප්‍රමුඛ ස්ථානයක් ගත් විශ්වවිද්‍යාලයකි, බාහිර උපාධි පාඨමාලා සඳහා වැඩිම ශිෂ්‍ය සංඛ්‍යාවක් ලියාපදිංචි වන විශ්වවිද්‍යාලය වන්නේ ද අප විශ්වවිද්‍යාලයයි. විශ්වවිද්‍යාල අභ්‍යන්තර සිසුන්ට මෙන්ම බාහිර උපාධිධාරීන්ට අභිමානයෙන් යුතුව තම උපාධි ලබාගැනීමට හැකි වන පරිදි ශ්‍රී ලංකාවේ මුල් වරට බාහිර උපාධි ප්‍රදානෝත්සවයක් පැවැත්වීමට ද කටයුතු කළේ ද ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය බව සතුටින් සඳහන් කරනු කැමැත්තෙමි.

බාහිර උපාධි පාඨමාලා ආරම්භ කළ මුල් කාල වකවානුවේ, සිසුන් ලියාපදිංචි කිරීම හා වාර්ෂිකව විභාග පැවැත්වීම යන කාරණා පමණක් විශ්වවිද්‍යාලයෙන් සිදු කරනු ලැබූ අතර, ක්‍රමයෙන් බාහිර උපාධි අපේක්ෂකයින් වැඩි වීමත් සමග බාහිර උපාධි අපේක්ෂකයින්ට පහසුවක් වන පරිදි හා පාඨමාලාවේ ගුණාත්මක භාවය වැඩි කරනු වස් විශ්වවිද්‍යාල ආචාර්ය මණ්ඩලයේ සහභාගීත්වයෙන් අදාළ විෂයන් සඳහා විෂය ප්‍රතිපෝෂක සම්මන්ත්‍රණ පැවැත්වීම ආරම්භ කර මේ වන විට නව තාක්ෂණික ක්‍රම ද උපයෝගී කර ගනිමින් වැඩි දියුණු කර ගනිමින් සිදු කරගෙන යනු ලබයි.

බාහිර උපාධි සඳහා ලියාපදිංචි වීමෙන් අනතුරුව නියමිත කාල වකවානු තුළ පරීක්ෂණවලට පෙනී සිටීමෙන් උපාධි අපේක්ෂකයන්ට තම ඉලක්ක කරා පහසුවෙන් ළඟාවීමට අවස්ථාව විශ්වවිද්‍යාලය මගින් සලසා දී ඇති බව සතුටින් සඳහන් කරමි. ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ බාහිර උපාධි පාඨමාලා සඳහා ලියාපදිංචි වන ඔබ අප විශ්වවිද්‍යාලය මගින් සපයා ඇති පහසුකම් උපරිම ලෙස ප්‍රයෝජනයට ගෙන දැනුමින් හැකියාවෙන් පිරිපුන්, රට දැය සංවර්ධනය වෙනුවෙන් ඵලදායී මෙහෙයක් කළ හැකි දක්ෂතා සහිත උපාධිධාරියෙක් වනු දැකීම විශ්වවිද්‍යාලයේ පරම අපේක්ෂාවයි.

## පටුන


1. හැඳින්වීම ........................................................................... 10
2. බාහිර උපාධි හා විස්තාරිත පාඨමාලා ඒකකය.......................................... 11-13
3. බාහිර උපාධි හා විස්තාරිත පාඨමාලා ඒකකයේ කළමනාකරණ කමිටුව සහ බාහිර උපාධි අධ්‍යයන මණ්ඩල ........................................... 14
4. බාහිර උපාධි පාඨමාලා සඳහා ලියාපදිංචිය.............................................. 15-17
5. පාඨමාලා ඒකක ක්‍රමය......................................................................... 17
6. පාඨමාලා ඒකක කේත ......................................................................... 18
7. පාඨමාලා ඒකක අගය.......................................................................... 18
8. පාඨමාලා ඒකක.................................................................................. 19-20
9. මානවශාස්ත්‍ර හා සමාජීයවිද්‍යා පීඨය මගින් බාහිර උපාධි සහ විස්තාරිත පාඨමාලා ඒකකය යටතේ ඉදිරිපත් කරනු ලබන උපාධි පාඨමාලා සහ පාඨමාලා ඒකක............................ 21
   ශාස්ත්‍රවේදී (සාමාන්‍ය) බාහිර උපාධි පාඨමාලාව............................................. 22-23
10. අධ්‍යයනාංශ සහ ඒවාට අදාළ පාඨමාලා ඒකක............................................ 24-40
11. සමාජීයවිද්‍යාවේදී පාරිසරික හා සංවර්ධන අධ්‍යයන (සාමාන්‍ය) බාහිර උපාධි පාඨමාලාව........ 41-44
12. ශාස්ත්‍රවේදී ඉංග්‍රීසි (සාමාන්‍ය) බාහිර උපාධි ............................................ 45-56
13. පාඨමාලා ඒකක සඳහා ලියාපදිංචි වීම සහ වෙනස් කර ගැනීම.......................... 56-57

    14.01 පාඨමාලා ඒකක සඳහා ලියාපදිංචි වීම............................................. 56
    14.02 පාඨමාලා ඒකක වෙනස් කර ගැනීම................................................. 57

14. පැවරුම්, ඇගයීම් ක්‍රමය සහ ශ්‍රේණි පටිපාටිය............................................ 57-59
15. ශ්‍රේණි පටිපාටිය සහ ශ්‍රේණි ලකුණු සාමාන්‍යය............................................ 59-65
16. විභාග නිර්ණායක (GPA) සහ උපාධි ආවශ්‍යකතා............................................ 66-70
17. පන්ති සාමර්ථ්‍යය ප්‍රදානය.................................................................... 70-72
18. විභාග අක්‍රමිකතා............................................................................. 72-73
19. උපාධිය වලංගු වන දිනය සහ උපාධි ප්‍රදානෝත්සවය..................................... 73-75

# හැඳින්වීම

ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය වූකලී ශිෂ්‍ය සංඛ්‍යාව අතින් මෙරට ඇති විශාලතම විශ්වවිද්‍යාලය යි. එය ආරම්භ වූයේ 1959 වර්ෂයේ දී වුවත් එහි අතීතය වර්ෂ 1883 දී හික්කඩුවේ ශ්‍රී සුමංගල හිමිපාණන් විසින් ආරම්භ කරන ලද එවකට දේශීය අධ්‍යාපනයේ කේන්ද්‍රස්ථානයක් වූ මාලිගාකන්දේ විද්‍යෝදය පිරිවෙණ දක්වා ඈතට දිව යයි. වත්මන් ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ ආරම්භක අධ්‍යාපන ආයතනය වන්නේ එම විද්‍යාස්ථානය යි. එනයින් ගත් කල විශ්වවිද්‍යාලයේ ඉතිහාසය වසර 145 කටත් වඩා ඈතට දිව යයි. 1958 අංක 45 දරන විශ්වවිද්‍යාල පනතට අනුව **විද්‍යෝදය විශ්වවිද්‍යාලය** නමින් 1959 පෙබරවාරි 18 වන දින කොළඹ මාලිගාකන්දේ විද්‍යෝදය පිරිවෙනෙහි ශ්‍රී සුමංගල මන්දිරයේ ශිෂ්‍යයින් 14 දෙනකුගෙන් ස්ථාපිත කරන ලද මෙම විශ්වවිද්‍යාලයේ ප්‍රථම විශ්වවිද්‍යාලයාධිපතීන් වහන්සේ ලෙස පත් වූයේ සාහිත්‍ය චක්‍රවර්ති, රාජකීය පණ්ඩිත අතිගෞරවාර්හ වැලිවිටියේ ශ්‍රී සෝරත නාහිමිපාණන් වහන්සේ ය. 1961 නොවැම්බර් 22 දින මාලිගාකන්දේ සිට වර්තමාන විශ්වවිද්‍යාල පරිශ්‍රය පිහිටා ඇති ගංගොඩවිල භූමි භාගය වෙත විශ්වවිද්‍යාලය රැගෙන එන ලදි. 1972 අංක 01 දරන ලංකා විශ්වවිද්‍යාල පනත මගින් සිදු කරන ලද සංශෝධන අනුව විද්‍යෝදය විශ්වවිද්‍යාලය, ශ්‍රී ලංකා විශ්වවිද්‍යාලයේ විද්‍යෝදය මණ්ඩපය වශයෙන් නම් කෙරිණි. දැනට ක්‍රියාත්මක 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල (සංශෝධිත) පනත මගින් එය **ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය** ලෙසින් යළිත් ස්වාධීන විශ්වවිද්‍යාලයක් බවට පත් විය.

ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ වර්තමාන පීඨ සංඛ්‍යාව අටක් වුවත් එහි ආරම්භක යුගයේ දී පැවතියේ මානවශාස්ත්‍ර හා සමාජීයවිද්‍යා විෂයක්ෂේත්‍ර නියෝජනය කරන කලා, බෞද්ධ අධ්‍යයන, දර්ශනය සහ භාෂා යන පීඨයන් පමණි. 1966 වසරේ දී එකී පීඨ සතර ඒකාබද්ධ වෙමින් **ශාස්ත්‍ර පීඨය (කලා පීඨය)** බිහි වූ අතර ඒ යටතේ අධ්‍යයනාංශ 12 ක් ක්‍රියාත්මක වූ බව ඉතිහාසයේ දැක්වෙයි. මීට සමගාමීව පිළිවෙලින් 1966 දී සහ 1972 දී ශ්‍රී ලංකාවේ විශ්වවිද්‍යාල පද්ධතියෙහි ප්‍රථම ව්‍යවහාරික විද්‍යා පීඨයත්, ප්‍රථම

කළමනාකරණ පීඨයත් පිහිටුවමින් සීඝ්‍රයෙන් දියුණුවට පත්වන ජාතික විශ්වවිද්‍යාලයක් බවට ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය පත් විය. වසර 50 කට ආසන්න කාලයක් පුරා ලෝකප්‍රකට පඬිවරුන් බිහි කළ කීර්තිමත් පීඨයක් බවට පත්ව තිබූ ශාස්ත්‍ර පීඨය, **මානවශාස්ත්‍ර හා සමාජීයවිද්‍යා පීඨය** ලෙසින් 2011 වසරේ දී නාම සංශෝධනයකට ලක් විය. වර්තමානයේ අපරාධ විද්‍යාව හා අපරාධ යුක්තිය, ආර්ථික විද්‍යාව, ඉංග්‍රීසි හා වාග්විද්‍යාව, ඉංග්‍රීසි භාෂාව ඉගැන්වීම, භූගෝල විද්‍යාව, ඉතිහාසය සහ පුරා විද්‍යාව, භාෂා, සංස්කෘතික අධ්‍යයන හා ප්‍රාසාංගික කලා, පාලි හා බෞද්ධ අධ්‍යයන, මානව විද්‍යාව, දර්ශනය හා මනෝ විද්‍යාව, දේශපාලන විද්‍යාව, සිංහල හා ජනසන්නිවේදනය, සමාජ සංඛ්‍යානය සහ සමාජ විද්‍යාව යන අධ්‍යයනාංශ 14 යටතේ අභ්‍යන්තර උපාධි පාඨමාලා 28 ක් ක්‍රියාත්මක වන අතර බාහිර උපාධි පාඨමාලා 03 ක් ක්‍රියාත්මක වෙයි. දළ වශයෙන් 3500 කට ආසන්න අභ්‍යන්තර ශිෂ්‍ය සංඛ්‍යාවක් ද 100000 ට ආසන්න බාහිර ශිෂ්‍ය සංඛ්‍යාවක් ද වර්තමානයේ මානවශාස්ත්‍ර හා සමාජීයවිද්‍යා පීඨය යටතේ ඉගෙනුම ලබති.

## බාහිර උපාධි සහ විස්තාරිත පාඨමාලා ඒකකය

ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය මගින් බාහිර උපාධි පාඨමාලා පැවැත්වීමේ ඉතිහාසය එහි ආරම්භක අවධිය තෙක් ම දිව යයි. එවකට විද්‍යෝදය විශ්වවිද්‍යාලය මගින් හඳුන්වා දුන් පාඨමාලා අතර ශාස්ත්‍රවේදී (බාහිර) උපාධි පාඨමාලාව ද ඉතා ජනප්‍රිය වූවකි. ශාස්ත්‍රාභිලාශී විශාල පිරිසකට විශ්වවිද්‍යාල ප්‍රවේශයට ඉඩක් නොමැති වීමත්, මුල් අවධියේ දී අභ්‍යන්තර ශිෂ්‍යයන් ලෙස කාන්තාවන් බඳවා නොගැනීමත් බාහිර කලා උපාධි පාඨමාලාව හඳුන්වා දීමට හේතු විය. එවකට ලක්දිව ප්‍රකට විද්‍යායතන පිරිවෙන් මගින් විද්‍යෝදය බාහිර කලා උපාධි පාඨමාලාව සඳහා ඉගැන්වීම් සිදු කරමින් සුවිශාල දායකත්වයක් සපයන ලදී. 1972 සංශෝධනයට අනුව බාහිර උපාධි පාඨමාලා සහ ඊට අදාල විභාග පැවැත්වීම සඳහා සියලු විශ්වවිද්‍යාලවලට පොදු එක් බාහිර උපාධි ඒකකයක් ස්ථාපිත කිරීමේ ප්‍රතිඵලයක් ලෙසින් දීර්ඝ කාලයක් පවත්වාගෙන ආ බාහිර උපාධි පැවැත්වීමේ අයිතිය විශ්වවිද්‍යාලයට අහිමි විය. 1978 සංශෝධනයෙන්

පසුව යළිත් සීමිත අවස්ථාවක් හිමි වූ අතර ඒ අනුව ශාස්ත්‍රවේදී සහ විද්‍යාවේදී උපාධිය පේරාදෙණිය විශ්වවිද්‍යාලයට ද, වාණිජවේදී උපාධිය ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයට ද භාර කරමින් ප්‍රතිසංවිධානය විය. එයට සමගාමීව 1979 දී ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ බාහිර උපාධි පාඨමාලා මෙහෙයවීම සඳහා **බාහිර උපාධි ඒකකය** නමින් වෙනම අංශයක් පිහිටුවන ලදි. 1991 දී නැවත වරක් ශාස්ත්‍රවේදී බාහිර උපාධි පාඨමාලා පැවැත්වීමට ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයට අවස්ථාව ලබාගත හැකි වූ අතර 1997 දී විද්‍යාවේදී රාජ්‍ය පරිපාලන හා ව්‍යාපාර පරිපාලන බාහිර උපාධි පාඨමාලා ද හඳුන්වා දෙනු ලැබීය. 2010 ඔක්තෝබර් මස 15 වන දින නිකුත් කරන ලද විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා චක්‍රලේඛ 932 ට අනුව ශ්‍රී ලංකාවේ ජාතික විශ්වවිද්‍යාල මගින් පිරිනැමෙන බාහිර උපාධි පාඨමාලා සඳහා සිසුන් බඳවා ගැනීම, පාඨමාලා මෙහෙයවීම හා කළමණාකරණය පිළිබඳ පුළුල් සංශෝධනයක් ඉදිරිපත් කරන ලදි. ඒ අනුව ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ එතෙක් ක්‍රියාත්මක වූ බාහිර උපාධි ඒකකය ව්‍යුහාත්මක වෙනසකට ලක්වෙමින් **බාහිර උපාධි හා විස්තාරිත පාඨමාලා ඒකකය** බවට පත් විය. උපකුලපතිවරයාගේ වගකීම යටතේ ක්‍රියාත්මක වන අධ්‍යක්ෂවරයකු හා නියෝජ්‍ය අධ්‍යක්‍ෂකවරුන් තිදෙනකුගෙන් ද, පීඨාධිපතිවරු, අධ්‍යයනාංශ ප්‍රධානවරු, අධ්‍යයන මණ්ඩල සභාපතිවරු, පාඨමාලා සමායෝජකවරු හා දේශකවරුන් ප්‍රමුඛ අධ්‍යයන කාර්ය මණ්ඩලයකින් ද, ලේඛකාධිකාරීවරයා යටතේ ක්‍රියාත්මක ජ්‍යෙෂ්ඨ සහකාර ලේඛකාධිකාරී/සහකාර ලේඛකාධිකාරී ඇතුළු අනධ්‍යයන කාර්ය මණ්ඩලයකින් ද, මූල්‍යාධිකාරී යටතේ ක්‍රියාත්මක සහකාර මූල්‍යාධිකාරීවරයකුගෙන් ද මෙම ඒකකය සමන්විත වෙයි. බාහිර උපාධි අපේක්ෂකයන් ලියාපදිංචි කිරීමේ සිට උපාධි ප්‍රදානෝත්සවය දක්වා වූ ක්‍රියාවලිය වඩා කාර්යක්ෂමව සහ වගකීම් සහිතව පවත්වාගනු වස් උපකුලපතිවරයා සභාපතිත්වය දරණ කළමනාකරණ මණ්ඩලයේ පූර්ණ පරිපාලනයට සහ අධීක්ෂණයට බාහිර උපාධි සහ විස්තාරිත පාඨමාලා ඒකකය යටත් වේ. බාහිර උපාධි පාඨමාලා සම්බන්ධ සියලුම අධ්‍යයන කටයුතු පිළිබඳ තීරණ ගැනීමේ දී උක්ත චක්‍රලේඛය අනුව පිහිටුවා ඇති අධ්‍යයන මණ්ඩල ද, ඒවාට අදාල පීඨ මණ්ඩල ද, අවසානයේ විශ්වවිද්‍යාලයීය සනාථ සභාව ද

අන්‍යොන්‍ය වශයෙන් සම්බන්ධ වෙයි. බාහිර උපාධි සහ විස්තාරිත පාඨමාලා ඒකකය බාහිර උපාධි අපේක්ෂකයන් සම්බන්ධ විශ්වවිද්‍යාලයේ ස්ථාපිත එකම ආයතනය වේ.

## බාහිර උපාධි හා විස්තාරිත පාඨමාලා ඒකකයේ ප්‍රධාන කාර්යයන්

1. බාහිර උපාධි අපේක්ෂකයන් ලියාපදිංචි කිරීම.
2. බාහිර උපාධි අධ්‍යයන කටයුතු සඳහා වෙනත් ආයතන තෝරා ගැනීම හා අධීක්ෂණයට ලක්කිරීම.
3. විශ්වවිද්‍යාල ආචාර්යවරුන්ගේ දායකත්වය ලබාගෙන දේශන, විෂය ප්‍රතිපෝෂක සම්මන්ත්‍රණ, ප්‍රායෝගික වැඩමුළු සංවිධානය කිරීම හා පැවැත්වීම.
4. විභාග අයැදුම්පත් කැඳවීම, විභාග කාල සටහන් සැකසීම, ප්‍රවේශ පත්‍ර සහ විභාග නීති මාලාව අපේක්ෂකයන් වෙත ලබාදීම.
5. ප්‍රශ්නපත්‍ර මුද්‍රණය කිරීම සහ අදාළ විභාග මධ්‍යස්ථාන වලට නිකුත් කිරීම, නියමිත දිනට විභාග පැවැත්වීමේ කටයුතු සංවිධානය කිරීම.
6. විභාග ප්‍රතිඵල නිකුත් කිරීම.
7. උපාධි ප්‍රදානෝත්සවය සංවිධානය කිරීම සහ පැවැත්වීම.
8. තාවකාලික සහතික පත්‍ර, විස්තරාත්මක ශ්‍රේණි සහතික, මුද්‍රිත උපාධි සහතික සහ ප්‍රතිඵල සනාථ කිරීමේ ලිපි නිකුත් කිරීම.

## බාහිර උපාධි සහ විස්තාරිත පාඨමාලා ඒකකයේ කළමනාකරණ කමිටුව සහ බාහිර උපාධි අධ්‍යයන මණ්ඩල

විශ්වවිද්‍යාලය මගින් පවත්වාගෙන යනු ලබන බාහිර උපාධි සම්බන්ධ සියලුම පරිපාලන කටයුතු බාහිර උපාධි හා විස්තාරිත පාඨමාලා ඒකකයේ කළමනාකරණ කමිටුව මගින් මෙහෙයවනු ලැබේ. උපකුලපතිවරයා මෙහි සභාපති වන අතර, අධ්‍යක්ෂ/ බාහිර උපාධි හා විස්තාරිත පාඨමාලා ඒකකය, සමායෝජක/අධ්‍යයන පහසුකම්, සමායෝජක/ලියාපදිංචි කිරීම් හා විභාග, සමායෝජක/ඇගයීම් හා ශික්ෂණ සහායතා අදාළ පීඨයන්හි පීඨාධිපතිවරුන්, ලේඛකාධිකාරිවරයා, මූල්‍යාධිකාරීතුමිය, පාඨමාලාවන්ට අදාළ අධ්‍යයනාංශ ප්‍රධානවරුන් සහ පාඨමාලා සමායෝජකවරු, බාහිර උපාධි හා විස්තාරිත පාඨමාලා ඒකකයේ ජ්‍යෙෂ්ඨ සහකාර ලේඛකාධිකාරී සහ ජ්‍යෙෂ්ඨ සහකාර මූල්‍යාධිකාරී මෙහි සාමාජිකයෝ වෙති. මෙම කළමනාකරණ කමිටුව විසින් කරනු ලබන නිර්දේශ ක්‍රියාත්මක වන්නේ සනාතන සභාවේ සහ පාලක සභාවේ අනුමැතියට යටත්ව ය.

මීට අමතරව, මානවශාස්ත්‍ර හා සමාජීය පීඨය සහ කළමනාකරණ අධ්‍යයන හා වාණිජ විද්‍යා පීඨයට අදාළ බාහිර උපාධි පාඨමාලාවලට සම්බන්ධ සියලුම අධ්‍යයන කටයුතු පිළිවෙළින් මානවශාස්ත්‍ර හා සමාජීයවිද්‍යා පීඨ බාහිර උපාධි අධ්‍යයන මණ්ඩලය සහ කළමනාකරණ අධ්‍යයන හා වාණිජවිද්‍යා පීඨ බාහිර උපාධි අධ්‍යයන මණ්ඩලයේ අධීක්ෂණය යටතේ සිදුවේ.

# බාහිර උපාධි පාඨමාලා සඳහා ලියාපදිංචිය

## ලියාපදිංචිය සඳහා අයැදුම්පත් කැඳවීම

ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ බාහිර උපාධි පාඨමාලා සඳහා උපාධි අපේක්ෂකයන් ලියාපදිංචි කිරීම වාර්ෂිකව සිදු කෙරේ. මේ සඳහා පුවත්පත් මගින් සහ බාහිර උපාධි හා විස්තාරිත පාඨමාලා ඒකකයේ නිල වෙබ් අඩවිය මගින් නිවේදන නිකුත් කරනු ලැබේ. තවද අයැදුම්පත් කැඳවීම සිදු කරනු ලබන්නේ ද බාහිර උපාධි හා විස්තාරිත පාඨමාලා ඒකකයේ නිල වෙබ් අඩවිය මගින් වන අතර අයැදුම්කරුවන් වෙබ් අඩවිය හරහා මාර්ගගත ක්‍රමය යටතේ අයැදුම්පත් යොමු කළ යුතුය.

## ලියාපදිංචිය සඳහා තෝරා ගැනීම

අදාළ වර්ෂය සඳහා බාහිර උපාධි අයැදුම්කරුවන් නිශ්චිත ප්‍රමාණයක් බඳවාගනු ලැබේ. එබැවින් ලියාපදිංචි වීම සඳහා අපේක්ෂකයින්ගේ සංඛ්‍යාව, සීමාව ඉක්මවා යන අවස්ථාවලදී නිශ්චිත ප්‍රමාණය තෝරා ගැනීමට අභියෝගතා පරීක්ෂණයක් පවත්වනු ලබන අතර, ඉන් ඉහළම ලකුණු ලබාගන්නා අය අතුරින් අවශ්‍ය අපේක්ෂකයන් ප්‍රමාණය බාහිර උපාධි පාඨමාලාවන් සඳහා ලියාපදිංචි කෙරේ. මෙම පරීක්ෂණයෙන් සමත් වුවද ඇතැම් පාඨමාලා ඒකක සඳහා වෙනත් ප්‍රායෝගික පරීක්ෂණයන්ට පෙනී සිටීමට සිදු විය හැකිය. විශ්වවිද්‍යාලය මගින් පවත්වනු ලබන එම පරීක්ෂණවලදී අපේක්ෂිත මට්ටමට ළඟා විය නොහැකි අයැදුම්කරුවන්ට වෙනත් විෂයයක් තෝරා ගත හැකිය.

## කාල සීමාව

බාහිර උපාධි පාඨමාලාවල අධ්‍යයන කාල සීමාව වර්ෂ 03කි.

## ගාස්තු

- ලියාපදිංචි ගාස්තු (වසර 03 සඳහාම) - රු. 10,000/-
- පාඨමාලා ගාස්තු - රු.100,000/-
- විභාග ගාස්තු (එක් පරීක්ෂණයක් සඳහා) - රු. 6,000/-

## ලියාපදිංචි කාලසීමාව

බාහිර උපාධි පාඨමාලාවක් සඳහා ලියාපදිංචි වීමේදී ප්‍රථමයෙන්ම වසර තුනක කාල සීමාවක් සඳහා ලියාපදිංචි කිරීම සිදු කරනු ලැබේ.

නියමිත කාලය තුළ තම ලියාපදිංචිය අඛණ්ඩව පවත්වාගෙන යාම සිසුන්ගේ වගකීමක් වන අතර ඊට අපොහොසත් වන උපාධි අපේක්ෂකයකු වෙතොත් ඔහු හෝ ඇය තම ලියාපදිංචිය යාවත්කාලීන කර ගැනීම සඳහා ඉල්ලීමක් ඉදිරිපත් කිරීමෙන් එක් වසරක් සඳහා රු.5,000/- බැගින් ගෙවීම් කර වසරින් වසර ලියාපදිංචිය දීර්ඝ කරගත හැකිය. මෙලෙස ලියාපදිංචිය දීර්ඝ කිරීමේ උපරිම කාල සීමාව වසර 07ක් දක්වා වේ.

ලියාපදිංචිය දීර්ඝ කිරීම සඳහා වූ අයැදුම්පත ද ගෙවීම් වවුචර්පත් ද බාහිර උපාධි හා විස්තාරිත පාඨමාලා ඒකකය මගින් හෝ වෙබ් අඩවිය මගින් ලබා ගත හැකිය.

## බාහිර උපාධි අපේක්ෂක ශිෂ්‍ය වාර්තා පොත

බාහිර උපාධි පාඨමාලා සඳහා අයැදුම් කර සුදුසුකම් සපුරා ඇති සෑම ශිෂ්‍යයෙකු සඳහාම ලියාපදිංචි කිරීමෙන් අනතුරුව ශිෂ්‍ය වාර්තා පොතක් විශ්වවිද්‍යාලය මගින් නිකුත් කරනු ලැබේ. සිය අධ්‍යයන කටයුතු කරගෙන යාමේ දී විශ්වවිද්‍යාලය සමඟ කෙරෙන සෑම කාර්යකදීම එම ශිෂ්‍ය වාර්තා පොත ඉදිරිපත් කිරීම අත්‍යවශ්‍ය වේ. එම ශිෂ්‍ය වාර්තා පොතෙහි ඇති ලියාපදිංචි අංකය විශ්වවිද්‍යාලය සමඟ කෙරෙන සෑම කටයුත්තකදීම සඳහන් කිරීම අත්‍යවශ්‍ය වේ. තමා ලියාපදිංචි වූ උපාධිය ලබා ගන්නා තෙක් මෙම ශිෂ්‍ය වාර්තා පොත විශ්වවිද්‍යාලය සතු වන අතර උපාධිය ලබා ගැනීමෙන් පසු ශිෂ්‍ය වාර්තා පොතේ අයිතිය අපේක්ෂකයා සතුවේ. බාහිර උපාධි අපේක්ෂකයකුගේ ලියාපදිංචිය අවලංගු කළ විට, ඔහුගේ ශිෂ්‍ය වාර්තා පොත විශ්වවිද්‍යාලයට භාර දිය යුතුය. බාහිර උපාධි අපේක්ෂක සටහන් පොත අස්ථානගත වූ විට ඒ සම්බන්ධව පොලීසියට පැමිණිල්ලක් කළ යුතු අතර, එම වාර්තා සමඟ මහජන බැංකුවේ ගිණුම් අංක 097- 1 -001-2315456 දරන ගිණුමට රු.1000/-ක් ගෙවීම් කර අදාළ වවුචරය සමඟ අතිරේක ඡායාරූපයක් සහ උප්පැන්න සහතිකයේ සහතික කරන ලද පිටපතක් සමග ඉදිරිපත් කිරීමෙන් අනතුරුව එහි පිටපතක් ලබා ගත හැකි වේ.

## පාඨමාලා ඒකක ක්‍රමය

මානවශාස්ත්‍ර හා සමාජීයවිද්‍යා පීඨයෙහි බාහිර උපාධි පාඨමාලා සකස් කර ඇත්තේ පාඨමාලා ඒකක ක්‍රමයට අනුවය. එම පාඨමාලා ඒකක වර්ෂ පූර්ණ ඒවා වන අතර සෑම අධ්‍යයන වර්ෂයක් ආරම්භයේදීම බාහිර උපාධි හා විස්තාරිත පාඨමාලා ඒකකය විසින් අධ්‍යයන කාල සටහනක් ප්‍රකාශයට පත් කෙරෙනු ඇත.

## පාඨමාලා ඒකක කේත

සෑම පාඨමාලා ඒකකයක්ම හැඳින්වීම සඳහා ඉංග්‍රීසි කැපිටල් අක්ෂර හතරකින් සහ ඉලක්කම් පහකින් යුතු කේතයක් භාවිත කැරේ. කිසියම් පාඨමාලා ඒකකයක් සඳහා භාවිත කරන කේතය මගින් එම ඒකකය අයත් වන අධ්‍යයන ක්ෂේත්‍රය දැක්වෙන අතර එම පාඨමාලා ඒකකය අයත් වන අධ්‍යයන වර්ෂය, පාඨමාලා ඒකකයේ අනුක්‍රමික අංකය සහ එම පාඨමාලාවේ ඒකක අගය නිරූපණය වේ.

| **STGE** | **1** | **1001.5** | **5** |
|---|---|---|---|
| අධ්‍යයන ක්ෂේත්‍රයේ කේතය | වර්ෂය | පාඨමාලා ඒකකයේ අනුක්‍රමික අංකය | ඒකක අගය |

**ඒ අනුව කේතය වන්නේ STGE 1001.5 ය.**

## පාඨමාලා ඒකකයක ඒකක අගය

පාඨමාලා ඒකකයක ඒකක අගය ශිෂ්‍ය සම්බන්ධීකරණ කාලය, ප්‍රතිපෝෂක සම්මන්ත්‍රණ, අඛණ්ඩ ඇගයීම්, ප්‍රායෝගික පරීක්ෂණ, ක්ෂේත්‍ර අධ්‍යයන යනාදිය මත තීරණය කැරේ. කිසියම් ශිෂ්‍යයෙකු ආචාර්යවරයෙකුගේ ඍජු අධීක්ෂණය යටතේ ගත කරන අධ්‍යයන කාලය සහ ශිෂ්‍යයා විසින් අධ්‍යයන කටයුතු සඳහා යොදනු ලබන මූලික කාලය ද ඇතුලුව ශිෂ්‍ය සම්බන්ධීකරණ පැය ගණන අර්ථ දැක්වේ. ඒ අනුව එක් ඒකක අගයක් සඳහා ශිෂ්‍ය සම්බන්ධීකරණ කාලය පැය 50කි.

## පාඨමාලා ඒකක

පීඨය මගින් අධ්‍යයන ක්ෂේත්‍ර **26**කට අයත් පාඨමාලා පවත්වා ගෙන යන අතර ඒවායේ නම් සහ කේත පහත වගුවේ දැක්වේ. උපාධි අපේක්ෂකයනට මෙම අධ්‍යයන ක්ෂේත්‍ර ඔස්සේ තම උපාධි පාඨමාලාව සැලසුම් කර ගත හැකිය. මෙම අධ්‍යයන ක්ෂේත්‍ර අධ්‍යයනාංශ 14 ක් යටතේ ක්‍රියාත්මක වේ.

| **අධ්‍යයනාංශය** | **අධ්‍යයන ක්ෂේත්‍රය** | **කේතය** |
|---|---|---|
| අපරාධ විද්‍යා හා අපරාධ යුක්ති | • අපරාධ විද්‍යාව | CRGE |
| ආර්ථික විද්‍යාව | • ආර්ථික විද්‍යාව | ECGE |
| ඉංග්‍රීසි හා වාග් විද්‍යා | • ඉංග්‍රීසි භාෂාව | ELAN |
| භූගෝල විද්‍යාව | • භූගෝල විද්‍යාව | GEGE |
| ඉතිහාස හා පුරාවිද්‍යාව | • ඉතිහාසය<br>• පුරාවිද්‍යාව | HIGE<br>ARGE |
| සංස්කෘතික අධ්‍යයන හා ප්‍රාසංගික කලා | • සංගීතය<br>• නර්තනය<br>• නාට්‍ය හා රංග කලාව<br>• සංස්කෘතික හා සෞන්දර්ය අධ්‍යයනය<br>• සංස්කෘත | MUGE<br>DAGE<br>DRGE<br>CUGE<br>SAGE |

| | | |
|---|---|---|
| | • හින්දි | HNGE |
| පාලි හා බෞද්ධ | • පාලි<br>• බෞද්ධ ශිෂ්ටාචාරය<br>• බෞද්ධ දර්ශනය | PAGE<br>BCGE<br>BPGE |
| දර්ශනය හා මනෝවිද්‍යාව | • දර්ශනය<br>• මනෝවිද්‍යාව | PHGE<br>PSGE |
| දේශපාලන විද්‍යාව | • දේශපාලන විද්‍යාව<br>• ජාත්‍යන්තර සම්බන්ධතා | POGE<br>IRGE |
| සිංහල හා ජනසන්නිවේදනය | • සිංහල<br>• ජනසන්නිවේදන | SIGE<br>CMGE |
| සමාජ සංඛ්‍යානය | • සමාජ සංඛ්‍යානය | STGE |
| සමාජ විද්‍යාව | • සමාජ විද්‍යාව | SOGE |
| මානව විද්‍යාව | • මානව විද්‍යාව | ANGE |
| ඉංග්‍රීසි භාෂාව ඉගැන්වීමේ අධ්‍යයනාංශය | • අනිවාර්ය ඉංග්‍රීසි පාඨමාලාව | |

## මානවශාස්ත්‍ර හා සමාජීයවිද්‍යා පීඨය මගින් බාහිර උපාධි සහ විස්තාරිත පාඨමාලා ඒකකය යටතේ ඉදිරිපත් කරනු ලබන උපාධි පාඨමාලා සහ පාඨමාලා ඒකක

මෙම පීඨයේ පාඨමාලා ඒකක ප්‍රධාන වශයෙන් කොටස් දෙකකින් යුක්ත වේ.

(අ) අනිවාර්ය පාඨමාලා ඒකක

(අ) අධ්‍යයන ක්ෂේත්‍රයන්ට අදාළ පාඨමාලා ඒකක

බාහිර උපාධි හා විස්තාරිත පාඨමාලා ඒකකයේ ලියාපදිංචි වන සෑම ශිෂ්‍යයෙකුම තම අධ්‍යයන ක්ෂේත්‍රයට/ක්ෂේත්‍රයන්ට අයත් පාඨමාලා ඒකකවලට අමතරව පළමු වර්ෂයේදී හා දෙවන වර්ෂයේදී පැවැත්වෙන පහත සඳහන් අනිවාර්ය පාඨමාලා ඒකක හැදෑරීම අත්‍යවශ්‍ය වේ.

| වසර | පාඨමාලා කේතය | පාඨමාලා ඒකකයේ නම | ඒකක අගය |
|---|---|---|---|
| පළමු වසර | ENGE 1005.2 | English | 2 |
| | SOSE 1006.2 | තොරතුරු තාක්ෂණය | 2 |
| දෙවන වසර | SOFT 2001.2 | ශ්‍රී ලාංකේය සමාජය | 2 |
| | SOFT 2002.2 | නායකත්වය හා පෞරුෂ සංවර්ධනය | 2 |

අනිවාර්ය පාඨමාලා ඒකක සඳහා සමස්ත ඒකක අගය 08 ක් වන අතර ශ්‍රේණි ලකුණු සාමාන්‍යය (GPA) ගණනය කිරීමේදී එම පාඨමාලා ඒකක සඳහා ලබා ගන්නා ඒකක අගයන්ද අදාළ කර ගනු ඇත.

මානවශාස්ත්‍ර හා සමාජීයවිද්‍යා පීඨය මගින් පහත දැක්වෙන උපාධි පාඨමාලා ඉදිරිපත් කරනු ලබයි.

(අ) ශාස්ත්‍රවේදී (සාමාන්‍ය) බාහිර උපාධි පාඨමාලාව - අධ්‍යයන වර්ෂ තුනකි.

(ආ) සමාජීය විද්‍යාවේදී පාරිසරික හා සංවර්ධන අධ්‍යයන (සාමාන්‍ය) බාහිර උපාධි පාඨමාලාව අධ්‍යයන වර්ෂ තුනකි.

(ඇ) Bachelor of Arts in English (General) External Degree – Three year programme

## (අ) ශාස්ත්‍රවේදී (සාමාන්‍ය) බාහිර උපාධි පාඨමාලාව

ශාස්ත්‍රවේදී (සාමාන්‍ය) බාහිර උපාධි පාඨමාලාව සැලසුම් කර ඇත්තේ අධ්‍යයන වර්ෂ තුනකදී සම්පූර්ණ කිරීම සඳහා ය. ඒ අනුව වසර තුනක් තුළ බෙදී යන ඒකක අගය 98 ක් වන පරිදි පාඨමාලා ඒකක 22 ක් (අනිවාර්ය පාඨමාලා ද ඇතුළු ව) තෝරාගත යුතුය.

**නිදර්ශනයඃ**

උපාධි අපේක්ෂකයකු විසින් ශාස්ත්‍රවේදී (සාමාන්‍ය) බාහිර උපාධිය සඳහා පාඨමාලා ඒකක තෝරා ගත යුතු ආකාරය පිළිබඳ නිදර්ශනයක් පහත දැක්වේ.

**පළමු වර්ෂය**

| ප්‍රධාන අධ්‍යයන ක්ෂේත්‍රයන් | ඒකක අගය |
|---|---|
| සමාජ සංඛ්‍යානය | ඒකක අගය 10 |
| ආර්ථික විද්‍යාව | ඒකක අගය 10 |
| බෞද්ධ ශිෂ්ටාචාරය | ඒකක අගය 10 |
| අනිවාර්ය ඉංග්‍රීසි | ඒකක අගය 02 |
| තොරතුරු තාක්ෂණය | ඒකක අගය 02 |

**දෙවන වර්ෂය**

| ප්‍රධාන අධ්‍යයන ක්ෂේත්‍රයන් | ඒකක අගය |
|---|---|
| සමාජ සංඛ්‍යානය | ඒකක අගය 10 |
| ආර්ථික විද්‍යාව | ඒකක අගය 10 |
| බෞද්ධ ශිෂ්ටාචාරය | ඒකක අගය 10 |
| ශ්‍රී ලාංකේය සමාජය | ඒකක අගය 02 |
| නායකත්වය හා පෞරුෂ සංවර්ධනය | ඒකක අගය 02 |

**තෙවන වර්ෂය**

| ප්‍රධාන අධ්‍යයන ක්ෂේත්‍රයන් | ඒකක අගය |
|---|---|
| සමාජ සංඛ්‍යානය | ඒකක අගය 10 |
| ආර්ථික විද්‍යාව | ඒකක අගය 10 |
| බෞද්ධ ශිෂ්ටාචාරය | ඒකක අගය 10 |

මුළු ඒකක අගය 98කි.

## අධ්‍යයනාංශ සහ ඒවාට අදාළ පාඨමාලා ඒකක

### අපරාධ විද්‍යා හා අපරාධ යුක්ති අධ්‍යයනාංශය

### අපරාධ විද්‍යාව පාඨමාලා ඒකක

| කේතය | පාඨමාලා ඒකකයේ නම | ඒකක අගය |
|---|---|---|
| **පළමු වසර** | | |
| CRGE 1001.5 | අපරාධ විද්‍යාවේ මූලික සංකල්ප | 05 |
| CRGE 1002.5 | අපරාධ යුක්ති ක්‍රමය | 05 |
| **දෙවන වසර** | | |
| CRGE 2001.5 | අපරාධ විද්‍යා පර්යේෂණ මූලධර්ම | 05 |
| CRGE 2002.5 | අපරාධ විද්‍යා න්‍යායයන් | 05 |
| **තෙවන වසර** | | |
| CRGE 3001.5 | සමකාලීන අපරාධ ප්‍රවණතා | 05 |
| CRGE 3003.5 | අපරාධ පාලනය හා නිවාරණය | 05 |

# ආර්ථික විද්‍යා අධ්‍යයනාංශය

## ආර්ථික විද්‍යාව පාඨමාලා ඒකක

| කේතය | පාඨමාලා ඒකකයේ නම | ඒකක අගය |
|---|---|---|
| **පළමු වසර** | | |
| ECGE 1001.5 | සූක්ෂම ආර්ථික විද්‍යා මූලධර්ම | 05 |
| ECGE 1002.5 | සාර්ව ආර්ථික විද්‍යා මූලධර්ම | 05 |
| **දෙවන වසර** | | |
| ECGE 2001.5 | අන්තර්මධ්‍ය සූක්ෂම ආර්ථිකවිද්‍යාව | 05 |
| ECGE 2002.5 | අන්තර්මධ්‍ය සාර්ව ආර්ථික විද්‍යාව | 05 |
| **තෙවන වසර** | | |
| ECGE 3001.5 | තත්කාලීන ආර්ථික ගැටලු | 05 |
| ECGE 3002.5 | රාජ්‍ය ආර්ථික විද්‍යාව | 05 |

# භූගෝල විද්‍යා අධ්‍යයනාංශය

## භූගෝල විද්‍යාව පාඨමාලා ඒකක

| කේතය | පාඨමාලා ඒකකයේ නම | ඒකක අගය |
|---|---|---|
| **පළමු වසර** | | |
| GEGE 1001.5 | භූගෝල විද්‍යා චින්තනය හා ක්‍රමවේදය | 05 |
| GEGE 1002.5 | භෞතික හා මානව භූගෝල විද්‍යාව | 05 |

| | | |
|---|---|---|
| **දෙවන වසර** | | |
| GEGE 2001.5 | සිතියම් විද්‍යාත්මක ක්‍රමශිල්ප | 05 |
| GEGE 2002.5 | භෞතික පරිසරය හා පරිසර කළමනාකරණය | 05 |
| **තෙවන වසර** | | |
| GEGE 3001.5 | සංවර්ධනය හා සැලසුම්කරණය | 05 |
| GEGE 3002.5 | තුලනාත්මක ප්‍රාදේශීය අධ්‍යයනය | 05 |

## ඉතිහාසය හා පුරාවිද්‍යා අධ්‍යයනාංශය

### ඉතිහාසය පාඨමාලා ඒකක

| කේතය | පාඨමාලා ඒකකයේ නම | ඒකක අගය |
|---|---|---|
| **පළමු වසර** | | |
| HIGE 1001.5 | පෙරදිග ඉතිහාසයේ බලවේග | 05 |
| HIGE 1002.5 | අපරදිග ඉතිහාසයේ බලවේග | 05 |
| **දෙවන වසර** | | |
| HIGE 2001.5 | ශ්‍රී ලංකා දේශපාලන ඉතිහාසය (ආරම්භයේ සිට ක්‍රි.ව. 1500 දක්වා) | 05 |
| HIGE 2002.5 | ඉන්දියා ඉතිහාසය (ආරම්භයේ සිට ක්‍රි.ව.1200 දක්වා) | 05 |
| **තෙවන වසර** | | |
| HIGE 3001.5 | ශ්‍රී ලංකාවේ දේශපාලන ඉතිහාසය (ක්‍රි.ව. 1500 සිට ක්‍රි.ව. 1948 දක්වා) | 05 |
| HIGE 3002.5 | යුරෝපා ඉතිහාසය (16 වැනි සියවසේ සිට 20 වැනි සියවස දක්වා) | 05 |

### පුරාවිද්‍යාව පාඨමාලා ඒකක

| කේතය | පාඨමාලා ඒකකයේ නම | ඒකක අගය |
|---|---|---|
| **පළමු වසර** | | |
| ARGE 1001.5 | ඉන්දියාවේ සහ ශ්‍රී ලංකාවේ පුරාවිද්‍යා ඉතිහාසය | 05 |
| ARGE 1002.5 | සම්භාව්‍ය චිත්‍ර හා මූර්ති | 05 |
| **දෙවන වසර** | | |
| ARGE 2001.5 | පුරාවිද්‍යාවේ මූලධර්ම හා ක්ෂේත්‍ර පුරාවිද්‍යාව | 05 |
| ARGE 2002.5 | අභිලේඛන හා අක්ෂර රූප විද්‍යාව | 05 |
| **තෙවන වසර** | | |
| ARGE 3001.5 | සම්භාව්‍ය වාස්තු විද්‍යාව හා නාණක විද්‍යාව | 05 |
| ARGE 3002.5 | ස්මාරක සංරක්ෂණය සහ පුරාවිද්‍යා උරුම කළමනාකරණය | 05 |

# Department of English

## English Course Units

| Code | Title of the Course Unit | Status | Pre-requisites |
|---|---|---|---|
| **First Year** | | | Selection Test |
| ELAN 1001.5 | Critical Reading & Writing | 05 | |
| ELAN 1002.5 | Understanding English Grammar | 05 | |
| **Second Year** | | | ELAN 1001, 1002 |
| ELAN 2001.5 | English for Employment | 05 | |
| ELAN 2002.5 | Linguistics 1: Phonetics/phonology, morphology, and syntax | | |

| Third Year | | | |
|---|---|---|---|
| ELAN 3001.5 | Linguistics 2: Sociolinguistics, Psycholinguistics, Historical Linguistics | 05 | |
| ELAN 3002.5 | Discourse Analysis | 05 | |

## භාෂා, සංස්කෘතික අධ්‍යයන හා ප්‍රාසංගික කලා අධ්‍යයනාංශය

### සංගීතය පාඨමාලා ඒකක

| කේතය | පාඨමාලා ඒකකයේ නම | ඒකක අගය | පූර්ව ආවශ්‍යකතා |
|---|---|---|---|
| පළමු වසර | | | |
| MUGE 1001.5 | උත්තර භාරතීය සංගීතය ප්‍රායෝගික I (ගායනය) | **05** | **නිපුණතා පරීක්ෂණයෙන් සමත්** |
| MUGE 1002.5 | හින්දුස්ථානී සංගීතය ප්‍රායෝගික I (වාදනය) | **05** | **නිපුණතා පරීක්ෂණයෙන් සමත්** |
| MUGE 1003.5 | හින්දුස්ථානී සංගීතය ප්‍රායෝගික I (තබ්ලා) | **05** | **නිපුණතා පරීක්ෂණයෙන් සමත්** |
| MUGE 1004.5 | භාරතීය සංගීත සිද්ධාන්ත හා ඉතිහාසය (ගායනය/වාදනය) | **05** | *MUGE 1001 හෝ MUGE 1003* |
| MUGE 1005.5 | භාරතීය සංගීත සිද්ධාන්ත හා ඉතිහාසය (තබ්ලා) | **05** | *MUGE 1004* |

| | | | |
|---|---|---|---|
| **දෙවන වසර** | | | |
| MUGE 2001.5 | හින්දුස්ථානී සංගීතය ප්‍රායෝගික II (ගායනය) | 05 | *MUGE 1001* |
| MUGE 2002.5 | හින්දුස්ථානී සංගීතය ප්‍රායෝගික II (වාදනය) | 05 | *MUGE 1003* |
| MUGE 2003.5 | හින්දුස්ථානී සංගීතය ප්‍රායෝගික II (තබ්ලා) | 05 | *MUGE 1004* |
| MUGE 2004.5 | අපරදිග සංගීත සිද්ධාන්ත | 05 | *MUGE 1001 හෝ 1003 හෝ 1004 හෝ 1005* |
| **තෙවන වසර** | | | |
| MUGE 3001.5 | හින්දුස්ථානී සංගීතය ප්‍රායෝගික III (ගායනය) | 05 | *MUGE 2001* |
| MUGE 3003.5 | හින්දුස්ථානී සංගීතය ප්‍රායෝගික III (වාදනය) | 05 | *MUGE 2003* |
| MUGE 3004.5 | හින්දුස්ථානී සංගීතය ප්‍රායෝගික III (තබ්ලා) | 05 | *MUGE 2004* |
| MUGE 3002.5 | රබීන්ද්‍ර සංගීතය හා දේශීය ජන සංගීතය | 05 | *MUGE 3001 හෝ 3003* |
| MUGE 3005.5 | ශ්‍රී ලාංකේය අවනද්ධ වාද්‍ය භාණ්ඩ (සිද්ධාන්ත හා ප්‍රායෝගික) | 05 | *MUGE 3004* |

## නර්තනය පාඨමාලා ඒකක

| කේතය | පාඨමාලා ඒකකයේ නම | ඒකක අගය | පූර්ව ආවශ්‍යකතා |
|---|---|---|---|
| **පළමු වසර** | | | නිපුණතා පරීක්ෂණයෙන් සමත් වීම |
| DAGE 1001.5 | දේශීය නර්තන ඉතිහාසය හා සිද්ධාන්ත | 05 | |
| DAGE 1002.5 | දේශීය නර්තන ප්‍රායෝගික I (උඩරට/ පහතරට/ සබරගමු) | 05 | |

| | | | |
|---|---|---|---|
| **දෙවන වසර** | | | |
| DAGE 2001.5 | භාරතීය නර්තන ඉතිහාසය හා සිද්ධාන්ත | 05 | |
| DAGE 2002.5 | නර්තන ප්‍රායෝගික II (උඩරට/පහතරට ) | 05 | DAGE 1002 |
| **තෙවන වසර** | | | |
| DAGE 3001.5 | ලෝක නර්තන සම්ප්‍රදායන් | 05 | |
| DAGE 3002.5 | නර්තන ප්‍රායෝගික III<br>(උඩරට/ පහතරට/ සබරගමු ) | 05 | DAGE 2002 |

## නාට්‍ය හා රංග කලාව පාඨමාලා ඒකක

| කේතය | පාඨමාලා ඒකකයේ නම | ඒකක අගය |
|---|---|---|
| **පළමු වසර** | | |
| DRGE 1001.5 | නාට්‍ය ප්‍රවේශය සහ ලෝකයේ පැරණි නාට්‍ය කලාව | 05 |
| DRGE 1002.5 | ශ්‍රී ලාංකේය නාට්‍ය කලාව | 05 |
| **දෙවන වසර** | | |
| DRGE 2001.5 | යුරෝපීය නාට්‍ය කලාව | 05 |
| DRGE 2002.5 | ශ්‍රී ලාංකේය නූතන නාට්‍ය කලාව | 05 |
| **තෙවන වසර** | | |
| DRGE 3001.5 | නාට්‍ය නිර්මාණකරණය හා රංගභූමි ශිල්පය | 05 |
| DRGE 3002.5 | නාට්‍ය රචනය හා විචාරය | 05 |

## සංස්කෘත පාඨමාලා ඒකක

| කේතය | පාඨමාලා ඒකකයේ නම | ඒකක අගය |
|---|---|---|
| **පළමු වසර** | | |
| SAGE 1001.5 | සංස්කෘත සාහිත්‍යය හා තද්දීය ඉතිහාසය | 05 |
| SAGE 1002.5 | සංස්කෘත ව්‍යාකරණය | 05 |
| **දෙවන වසර** | | |
| SAGE 2001.5 | සම්භාව්‍ය සංස්කෘත සාහිත්‍යය හා සංස්කෘත භාෂා අධ්‍යයනය | 05 |
| SAGE 2002.5 | සංස්කෘත නාට්‍ය සාහිත්‍යය | 05 |
| **තෙවන වසර** | | |
| SAGE 3001.5 | වෛදික හා බෞද්ධ සංස්කෘත සාහිත්‍යය | 05 |
| SAGE 3002.5 | සංස්කෘත කාව්‍ය විචාරවාද හා භාෂා අධ්‍යයනය | 05 |

## හින්දී පාඨමාලා ඒකක

| කේතය | පාඨමාලා ඒකකයේ නම | ඒකක අගය | පූර්ව ආවශ්‍යකතා |
|---|---|---|---|
| **පළමු වසර** | | | |
| HNGE 1001.5 | මූලික හින්දී ව්‍යාකරණ | 05 | නැත |
| HNGE 1002.5 | හින්දී සාහිත්‍ය ඉතිහාසය | 05 | නැත |
| **දෙවන වසර** | | | |
| HNGE 2001.5 | හින්දී ව්‍යාකරණ හා නිබන්ධ ලේඛනය | 05 | HNGE 1001 |
| HNGE 2002.5 | හින්දී ගද්‍ය හා පද්‍ය සාහිත්‍යය | 05 | HNGE 1001, 1002 |

| තෙවන වසර | | | |
|---|---|---|---|
| HNGE 3001.5 | හින්දී ඉතිහාසය හා පරිවර්තන කලාව | 05 | HNGE 1001, 1002, 2001, 2002 |
| HNGE 3002.5 | හින්දී ජන සාහිත්‍යය හා උත්තර භාරතීය සංස්කෘතිය | 05 | HNGE 1002, 2002 |

**සංස්කෘතික අධ්‍යයනය පාඨමාලා ඒකක**

| කේතය | පාඨමාලා ඒකකයේ නම | ඒකක අගය |
|---|---|---|
| පළමු වසර | | |
| CUGE 1003.5 | සංස්කෘතික අධ්‍යයන ප්‍රවේශය | 05 |
| CUGE 1004.5 | සෞන්දර්ය අධ්‍යයන ප්‍රවේශය | 05 |
| දෙවන වසර | | |
| CUGE 2002.5 | ලෝක ආගම් හා සංස්කෘති | 05 |
| CUGE 2003.5 | භාෂාව, සංස්කෘතිය හා සෞන්දර්යය | 05 |
| තෙවන වසර | | |
| CUGE 3001.5 | ශ්‍රී ලාංකේය ජන සම්ප්‍රදාය | 05 |
| CUGE 3002.5 | ශ්‍රී ලංකාවේ බෞද්ධ සංස්කෘතිය | 05 |

## පාලි හා බෞද්ධ අධ්‍යයනාංශය

**පාලි පාඨමාලා ඒකක**

| කේතය | පාඨමාලා ඒකකයේ නම | ඒකක අගය |
|---|---|---|
| **පළමු වසර** | | |
| PAGE 1001.5 | පාලි භාෂා ප්‍රවේශය | 05 |
| PAGE 1002.5 | පාලි සාහිත්‍ය ප්‍රවේශය | 05 |
| **දෙවන වසර** | | |
| PAGE 2001.5 | පාලි සාහිත්‍ය ඉතිහාසය | 05 |
| PAGE 2002.5 | නිර්දිෂ්ට ග්‍රන්ථ | 05 |
| **තෙවන වසර** | | |
| PAGE 3001.5 | ව්‍යාකරණ හා වාග් විද්‍යාව | 05 |
| PAGE 3002.5 | අනිර්දිෂ්ට ග්‍රන්ථ හා ධර්ම විනය | 05 |

## බෞද්ධ ශිෂ්ටාචාරය පාඨමාලා ඒකක

| කේතය | පාඨමාලා ඒකකයේ නම | ඒකක අගය |
|---|---|---|
| **පළමු වසර** | | |
| BCGE 1001.5 | භාරතීය බෞද්ධ ශිෂ්ටාචාරයෙහි ප්‍රභවය සහ පරිහානිය | 05 |
| BCGE 1002.5 | මූලධර්ම අධ්‍යයනය | 05 |
| **දෙවන වසර** | | |
| BCGE 2001.5 | ශ්‍රී ලංකාවේ බෞද්ධ ශිෂ්ටාචාරය | 05 |
| BCGE 2002.5 | බෞද්ධ සමාජ හා දර්ශනය | 05 |
| **තෙවන වසර** | | |
| BCGE 3001.5 | බෞද්ධ සංස්ථා අධ්‍යයනය | 05 |
| BCGE 3002.5 | බෞද්ධ සාහිත්‍යය හා කලා ශිල්ප | 05 |

### බෞද්ධ දර්ශනය පාඨමාලා ඒකක

| කේතය | පාඨමාලා ඒකකයේ නම | ඒකක අගය |
|---|---|---|
| පළමු වසර | | |
| BPGE 1001.5 | බෞද්ධ දර්ශනය අධ්‍යයන ප්‍රවේශය | 05 |
| BPGE 1002.5 | ආදී බෞද්ධ දර්ශනය | 05 |
| දෙවන වසර | | |
| BPGE 2001.5 | බෞද්ධ දර්ශනයේ ඥාන විභාගය | 05 |
| BPGE 2002.5 | බෞද්ධ දර්ශන ඉතිහාසය | 05 |
| තෙවන වසර | | |
| BPGE 3001.5 | බෞද්ධ මනෝවිද්‍යාව හා ආචාර විද්‍යාව | 05 |
| BPGE 3002.5 | බුදු සමය හා සමාජ ගැටලු | 05 |

## දර්ශනය හා මනෝවිද්‍යා අධ්‍යයනාංශය

### දර්ශනය පාඨමාලා ඒකක

| කේතය | පාඨමාලා ඒකකයේ නම | ඒකක අගය |
|---|---|---|
| පළමු වසර | | |
| PHGE 1001.5 | තර්ක ශාස්ත්‍රය හා විද්‍යාත්මක ක්‍රමය | 05 |
| PHGE 1002.5 | දාර්ශනික ගැටලු | 05 |
| දෙවන වසර | | |
| PHGE 2001.5 | බටහිර දර්ශනය | 05 |
| PHGE 2002.5 | භාරතීය දර්ශනය | 05 |

| තෙවන වසර | | |
|---|---|---|
| PHGE 3001.5 | සාමාන්‍ය මනෝවිද්‍යාව | 05 |
| PHGE 3002.5 | ආචාර විද්‍යාව හා සමකාලීන ගැටලු | 05 |

## මනෝ විද්‍යාව පාඨමාලා ඒකක

| කේතය | පාඨමාලා ඒකකයේ නම | ඒකක අගය |
|---|---|---|
| **පළමු වසර** | | |
| PSGE 1001.5 | සාමාන්‍ය මනෝ විද්‍යාව | 05 |
| PSGE 1002.5 | ව්‍යවහාරික මනෝ විද්‍යාව | 05 |
| **දෙවන වසර** | | |
| PSGE 2001.5 | පෞරුෂය පිළිබඳ මනෝ විද්‍යාව | 05 |
| PSGE 2002.5 | මිනිස් හැසිරීමේ ස්වභාවය | 05 |
| **තෙවන වසර** | | |
| PSGE 3001.5 | ප්‍රජානන මනෝ විද්‍යාව | 05 |
| PSGE 3002.5 | කාර්මික මනෝ විද්‍යාව | 05 |

## දේශපාලන විද්‍යා අධ්‍යයනාංශය

### දේශපාලන විද්‍යාව පාඨමාලා ඒකක

| කේතය | පාඨමාලා ඒකකයේ නම | ඒකක අගය |
|---|---|---|
| **පළමු වසර** | | |
| POGE 1001.5 | දේශපාලන විද්‍යාවේ මූලිකාංග | 05 |
| POGE 1002.5 | ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රමය සහ දේශපාලන වෙනස්වීම් | 05 |
| **දෙවන වසර** | | |
| POGE 2001.5 | දේශපාලන න්‍යාය | 05 |
| POGE 2002.5 | තුලනාත්මක දේශපාලනය හා ආණ්ඩුක්‍රමය | 05 |
| **තෙවන වසර** | | |
| POGE 3001.5 | දේශපාලන සමාජ විද්‍යාව | 05 |
| POGE 3002.5 | රාජ්‍ය පරිපාලනය | 05 |

### ජාත්‍යන්තර සම්බන්ධතා පාඨමාලා ඒකක

| කේතය | පාඨමාලා ඒකකයේ නම | ඒකක අගය |
|---|---|---|
| **පළමු වසර** | | |
| IRGE 1001.5 | ජාත්‍යන්තර සම්බන්ධතා පිළිබඳ හැඳින්වීමක් | 05 |
| IRGE 1002.5 | ජාත්‍යන්තර හා කලාපීය සංවිධාන | 05 |

| | | |
|---|---|---|
| **දෙවන වසර** | | |
| IRGE 2001.5 | ජාත්‍යන්තර දේශපාලනය | 05 |
| HIGE 2002.5 | ගැටුම් සහ ගැටුම් නිරාකරණය | 05 |
| **තෙවන වසර** | | |
| IRGE 3001.5 | ලෝක දේශපාලනයේ සමකාලීන ගැටලු | 05 |
| IRGE 3002.5 | ශ්‍රී ලංකාවේ විදේශ ප්‍රතිපත්තිය | 05 |

# සිංහල හා ජනසන්නිවේදන අධ්‍යයනාංශය

## සිංහල පාඨමාලා ඒකක

| කේතය | පාඨමාලා ඒකකයේ නම | ඒකක අගය |
|---|---|---|
| **පළමු වසර** | | |
| SIGE 1001.5 | සාහිත්‍ය ප්‍රවේශය | 05 |
| SIGE 1002.5 | භාෂා ප්‍රවේශය | 05 |
| **දෙවන වසර** | | |
| SIGE 2001.5 | සිංහල භාෂාවේ ඉතිහාසය හා ව්‍යාකරණ සම්ප්‍රදාය | 05 |
| SIGE 2002.5 | සිංහල ප්‍රබන්ධ සාහිත්‍යය | 05 |
| **තෙවන වසර** | | |
| SIGE 3001.5 | සම්භාව්‍ය සිංහල සාහිත්‍ය | 05 |
| SIGE 3002.5 | සිංහල සංස්කෘතිය | 05 |

## සන්නිවේදනය හා මාධ්‍ය අධ්‍යයනය පාඨමාලා ඒකක

<table>
<tr><th>කේතය</th><th>පාඨමාලා ඒකකයේ නම</th><th>ඒකක අගය</th><th>පූර්ව ආවශ්‍යකතා</th></tr>
<tr><td colspan="3">පළමු වසර</td><td rowspan="9">අ.පො.ස. උසස් පෙළ විභාගය සඳහා ජනසන්නිවේදනය විෂයය හදාරා තිබිය යුතුය</td></tr>
<tr><td>CMGE 1001.5</td><td>සන්නිවේදන මූලධර්ම</td><td>05</td></tr>
<tr><td>CMGE 1002.5</td><td>මාධ්‍ය අධ්‍යයනය හැඳින්වීම</td><td>05</td></tr>
<tr><td colspan="3">දෙවන වසර</td></tr>
<tr><td>CMGE 2001.5</td><td>භාවිත සන්නිවේදනය</td><td>05</td></tr>
<tr><td>CMGE 2002.5</td><td>ජනමාධ්‍ය භාවිතය</td><td>05</td></tr>
<tr><td colspan="3">තෙවන වසර</td></tr>
<tr><td>CMGE 3001.5</td><td>වෘත්තීය සන්නිවේදන</td><td>05</td></tr>
<tr><td>CMGE 3002.5</td><td>ජනමාධ්‍ය හා සමාජය</td><td>05</td></tr>
</table>

## සමාජ සංඛ්‍යාන අධ්‍යයනාංශය

### සමාජ සංඛ්‍යානය පාඨමාලා ඒකක

| කේතය | පාඨමාලා ඒකකයේ නම | ඒකක අගය | පූර්ව ආවශ්‍යකතා |
|---|---|---|---|
| **පළමු වසර** | | | |
| STGE 1001.5 | මූලික ගණිතය | 05 | නැත |
| STGE 1002.5 | මූලික සංඛ්‍යානය | 05 | නැත |

| | | | |
|---|---|---|---|
| **දෙවන වසර** | | | |
| STGE 2001.5 | සමාජීය විද්‍යාවන් සඳහා ගණිතය | 05 | STGE 2001 |
| STGE 2002.5 | සම්භාවිතා ව්‍යාප්ති සහ සංඛ්‍යාන අනුමිතිය | 05 | STGE 1002 |
| **තෙවන වසර** | | | |
| STGE 3001.5 | සමාජීය විද්‍යාවන් සඳහා සංඛ්‍යාන ක්‍රම | 05 | STGE 2002 |
| STGE 3002.5 | ප්‍රායෝගික සංඛ්‍යානය | 05 | STGE 2002 |

# සමාජ විද්‍යා අධ්‍යයනාංශය

## සමාජ විද්‍යාව පාඨමාලා ඒකක

| **කේතය** | **පාඨමාලා ඒකකයේ නම** | **ඒකක අගය** |
|---|---|---|
| **පළමු වසර** | | |
| SOGE 1001.5 | සමාජ විද්‍යා මූලික සංකල්ප | 05 |
| SOGE 1002.5 | සමකාලීන සමාජය හා සමාජ වෙනස්වීම | 05 |
| **දෙවන වසර** | | |
| SOGE 2001.5 | සමාජ විද්‍යා න්‍යාය | 05 |
| SOGE 2002.5 | ව්‍යවහාරික සමාජ විද්‍යාව | 05 |
| **තෙවන වසර** | | |
| SOGE 3001.5 | සමාජ විද්‍යාත්මක පර්යේෂණ ක්‍රම | 05 |
| SOGE 3002.5 | ප්‍රජා සංවර්ධනය පිළිබඳ සමාජ විද්‍යාව | 05 |

# මානව විද්‍යා අධ්‍යයනාංශය

## මානව විද්‍යාව පාඨමාලා ඒකක

| කේතය | පාඨමාලා ඒකකයේ නම | ඒකක අගය |
|---|---|---|
| **පළමු වසර** | | |
| ANGE 1001.5 | සංස්කෘතික මානව විද්‍යාව හැඳින්වීම | 05 |
| ANGE 1002.5 | භෞතික මානව විද්‍යාව හැඳින්වීම | 05 |
| **දෙවන වසර** | | |
| ANGE 2001.5 | මානව විද්‍යා න්‍යාය | 05 |
| ANGE 2002.5 | ජනශ්‍රැති අධ්‍යයනය හා අස්පර්ශනීය සංස්කෘතික උරුමය | 05 |
| **තෙවන වසර** | | |
| ANGE 3001.5 | මානව විද්‍යාව පර්යේෂණ ක්‍රම | 05 |
| ANGE 3002.5 | ව්‍යවහාරික මානව විද්‍යාව සහ සංවර්ධනය | 05 |

## (ආ) සමාජීය විද්‍යාවේදී පාරිසරික හා සංවර්ධන අධ්‍යයන (සාමාන්‍ය) බාහිර උපාධි පාඨමාලාව

## Bachelor of Social Sciences (General) External Degree in Environmental and Development Studies

### හැඳින්වීම

පාරිසරික හා සංවර්ධන අධ්‍යයන පිළිබඳ සමාජීය විද්‍යා (සාමාන්‍ය) බාහිර උපාධි පාඨමාලාව මූලික වශයෙන් සංවර්ධනය වන ශ්‍රී ලංකාවේ මානව සම්පත් ප්‍රවර්ධනය අරමුණු කර ගත් එකකි. පරිසරය හා සංවර්ධනය වත්මන් ධරණීය සංවර්ධන ක්‍රියාදාමයේ තීරණාත්මක සාධක වී ඇති බැවින් දැනුම මුල්කරගත් සමාජ ආර්ථික ක්‍රමය තුළ එයට සුවිශේෂ ස්ථානයක් හිමි වෙයි. පශ්චාද් යුද සමය තුළ ශීඝ්‍ර සංවර්ධන ක්‍රියාදාමයකට අවතීර්ණ වී සිටින ශ්‍රී ලංකාවට වර්තමානයේ වඩාත් ප්‍රශස්ත ලෙස මානව සම්පත් භාවිතයට ගැනීම උදෙසා නව ක්‍රමෝපායන් සෙවීමට සිදුවී තිබේ. මෙම පසුබිම තුළ පරිසරය හා සංවර්ධනය පිළිබඳ න්‍යායාත්මක දැනුම ඵලදායී ලෙස භාවිතයට ගත හැකි කුසලතාවෙන් සපිරි උපාධිධරයන් බිහිකිරීමේ කාලීන අවශ්‍යතාව කෙරෙහි අවධානය යොමු කරමින් ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ භූගෝල විද්‍යා අධ්‍යයනාංශය විසින් මෙම නව බාහිර උපාධි පාඨමාලාව ඉදිරිපත් කරනු ලැබේ.

ශ්‍රී ලංකාවේ ජාතික විශ්වවිද්‍යාලයකින් හඳුන්වා දෙනු ලබන සංවර්ධනය හා පරිසරය පිළිබඳ එකම බාහිර උපාධි පාඨමාලාව වන මෙය සංවර්ධනය සඳහා වඩාත් ඵලදායී ලෙස මානව සම්පත යොදා ගැනීමේ දිගුකාලීන අරමුණ ඉලක්ක කර ගනිමින් සකසා තිබේ. සංවර්ධන ක්ෂේත්‍රයට අදාළ විවිධ අංශයන්හි දිගුකාලීන සේවා පලපුරුද්ද ඇති වෘත්තිකයන් හට ද මෙම පාඨමාලාව හැදෑරීමේ අවකාශ සලසා ඇත්තේ උක්ත අරමුණ සාක්ෂාත් කරගනු පිණිසය. වඩාත් කාර්යක්ෂම වූ ඵලදායි සංවර්ධන ක්‍රියාවලියක නියමුවන් වශයෙන් ක්‍රියාකාරී මානව සම්පත් සංවර්ධනය කිරීම මෙම

පාඨමාලාවේ ජාතික අභිලාෂය වේ. සංවර්ධනය සහ පරිසරය පිළිබඳ මූලික අවබෝධය ලබා දෙමින් විවිධ ක්ෂේත්‍රයන් තුළ එම දැනුම භාවිතයට ගැනීමේ හැකියාව ප්‍රගුණ කරවීමත් සංවර්ධන සැලසුම්කරණයේ දී හා ක්‍රියාවට නැංවීමේ දී ප්‍රාදේශීය සංවර්ධනය හා පාරිසරික තිරසර බව යන අංශ දෙකම සමෝධානය කිරීමට හැකි උපාධිධරයන් බිහිකිරීමත් මෙම පාඨමාලාවේ අපේක්ෂිත ඵලය වෙයි. ශිෂ්‍ය ප්‍රජාවගේ මෙන් ම පුළුල් සමාජයේ ද යහපත උදෙසා අතිශය යෝග්‍ය වූ ශිල්ප ක්‍රම ඔස්සේ න්‍යායාත්මක සහ ව්‍යවහාරික ඥාන විතරණය සඳහා කැපවීමත්, නිර්මාණශීලී හා බුද්ධිමය පදනමකින් යුක්ත නව මත ඉදිරිපත් කිරීමේ නිදහසකින් යුත් සම අවස්ථා සහ අධ්‍යාපනික දියුණුවක් ඇතිකරන පරිසරයක් තුළ ඉගැන්වීමත්, ඥාන ගවේෂණය සහ පර්යේෂණ මගින් අවකාශීය අධ්‍යයනයේ නියුතු විශිෂ්ටත්වයේ කේන්ද්‍රය ලෙස වර්ධනය වීමත්, සිය මෙහෙවර වශයෙන් සලකන ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ භූගෝල විද්‍යා අධ්‍යයනාංශය මගින් මෙම පාඨමාලාව පවත්වාගෙන යනු ලැබේ.

පරිසරය හා සංවර්ධනය සම්බන්ධ විෂයක්ෂේත්‍ර රැසකින් මෙහි පාඨමාලා ව්‍යුහය සැකසී තිබේ. මිනිස් සමාජය සහ භෞතික ලෝකය අතර පවත්නා සංකීර්ණ වූත් එකිනෙකට බැඳුණු හා පරස්පර වූත් සම්බන්ධතා සාර්ව ප්‍රවේශයකින් අධ්‍යයනය කිරීමත්, සංවර්ධන ක්‍රියාවලියේ ගතිකත්වය හඳුනාගනිමින් න්‍යායාත්මක දැනුමත් ප්‍රායෝගික වශයෙන් භාවිතයට ගැනීම අරමුණු කරගත් පුළුල් විෂය පථයක් මෙම පාඨමාලාවට අයත් වේ.

ප්‍රථම වසර සඳහා පරිසරය හා සංවර්ධනය පිළිබඳ න්‍යායාත්මක දැනුම ලබාදීම අරමුණු කරගත් පාඨමාලා ඉදිරිපත් කර ඇති අතර දෙවන වසරේදී ඒ හා සම්බන්ධ ක්‍රම ශිල්ප කෙරෙහි අවධානය යොමු කර ඇත. අවසන් වසර පාඨමාලා ඒකක සැකසී ඇත්තේ ප්‍රතිපත්ති සම්පාදනය හා ඒවා ක්‍රියාවට නැංවීම අරමුණු කරගෙනය. ඉංග්‍රිසි භාෂාව, තොරතුරු තාක්ෂණය, කළමනාකරණ දැනුම සහ මෘදුක කුසලතා වර්ධනය උදෙසා ඉදිරිපත් කර ඇති පොදු විෂය ඒකක රාශියක් ද මෙම පාඨමාලාවට අන්තර්ගත වී තිබේ.

## පාඨමාලා ව්‍යුහය

| පාඨමාලා කේතය | පාඨමාලා ඒකකයේ නම | ස්වභාවය | ඒකක අගය |
|---|---|---|---|
| **පළමුවන වසර** | | | |
| GEDS 1001 | භෞතික පරිසරය | අනිවාර්ය | 05 |
| GEDS 1002 | මානව භූ දර්ශනය | අනිවාර්ය | 05 |
| GEDS 1003 | ආර්ථික කටයුතුවල අවකාශීය සංවිධානය | අනිවාර්ය | 05 |
| GEDS 1004 | මානව සම්පත් සැලසුම්කරණය | අනිවාර්ය | 05 |
| GEDS 1005 | සංවර්ධන සංකල්ප | අනිවාර්ය | 05 |
| GEDS 1006 | ප්‍රාදේශීය සංවර්ධනය | අනිවාර්ය | 05 |
| ENGE 1005 | අනිවාර්ය ඉංග්‍රීසි | පොදු | 02 |
| SOSE 1006 | තොරතුරු තාක්ෂණය | පොදු | 02 |
| **දෙවන වසර** | | | |
| GEDS 2001 | සංවර්ධන සැලසුම්කරණය සඳහා සිතියම් විද්‍යාව | අනිවාර්ය | 05 |
| GEDS 2002 | ස්වාභාවික සම්පත් කළමනාකරණය | අනිවාර්ය | 05 |
| GEDS 2003 | ග්‍රාමීය සංවර්ධනය සහ සැලසුම්කරණය | අනිවාර්ය | 05 |
| GEDS 2004 | සංවර්ධන අධ්‍යයන සඳහා සංඛ්‍යානය | අනිවාර්ය | 05 |

| | | | |
|---|---|---|---|
| GEDS 2005 | සමකාලීන සංවර්ධන ගැටලු | අනිවාර්ය | 05 |
| GEDS 2006 | සංවර්ධන සන්නිවේදනය | අනිවාර්ය | 05 |
| SOFT 2001 | ශ්‍රී ලාංකේය සමාජය | පොදු | 02 |
| SOFT 2002 | නායකත්වය හා පෞරුෂ සංවර්ධනය | පොදු | 02 |
| **තෙවන වසර** | | | |
| GEDS 3001 | ආපදා කළමනාකරණය | අනිවාර්ය | 05 |
| GEDS 3002 | පාරිසරික ප්‍රතිපත්ති සහ නීති | අනිවාර්ය | 05 |
| GEDS 3003 | ප්‍රාදේශීය සැලසුම්කරණය සහ අන්තරාංශ සම්බන්ධීකරණය | අනිවාර්ය | 05 |
| GEDS 3004 | නාගරික සැලසුම්කරණය සහ සංවර්ධනය | අනිවාර්ය | 05 |
| GEDS 3005 | සංවර්ධන සැලසුම්කරණය සඳහා භූගෝලීය තොරතුරු පද්ධති | අනිවාර්ය | 05 |
| GEDS 3006 | සමාජ සුභසාධනය සහ ප්‍රජා සංවර්ධනය | අනිවාර්ය | 05 |
| | **මුළු ඒකක අගය** | | **98** |

## (ඇ) Bachelor of Arts in English (General) External Degree

## Introduction

The External (General) Degree Program in English conducted by the Department of English and Linguistics under the Faculty of Humanities and Social Sciences consists of three core subjects, namely English Literature, English Language, and English Language Teaching Methodology. The programme is introduced with the intention of making a substantial contribution to national development by empowering the teachers of English with the necessary pedagogical knowledge and skills, by increasing the employability of the Sri Lankan graduates, and by making the students sufficiently qualified in English to take up challenges in an educational/professional setting.

## The Graduate Profile

The program aims at producing a graduate,

1) Who is able to apply pedagogic knowledge and training to teach English language and English literature competently.
2) Who is capable of making a substantial contribution to the theory and practice of ELT in terms of research, innovation, and critique.

3) Who possesses the ability to critically and independently respond to any work of literature and to disseminate literary knowledge.

4) Who can examine language from structural, historical, social, and psychological perspectives and use such knowledge in drawing insights about language and apply such knowledge in relevant contexts.

5) Who is sufficiently motivated to engage in life-long learning

## 1. Target Students

1. Teachers of English in government schools, pirivenas and private schools.
2. Those who hope to pursue a career in teaching.
3. Those who hope to study English Literature and Language in a local or foreign university.

## 2. Objectives

The main objectives in introducing this degree program are as follows:

1. To provide an educational qualification for those who are currently engaged in teaching English at different levels.

2. To improve the academic and professional standards of those who are currently engaged in the field of teaching.

3. To fill the gap that exists between the supply and the demand for high quality graduates in Sri Lanka in line with the government policy on higher education.

## 3. Entry Qualifications

**Entry Requirement**:
Selection Test conducted by the Department of English and Linguistics

**Duration of selection test**:
2 hours

**Intake**:
Between 500-600 students.

***Eligibility to apply for selection test:***

- Those who have obtained a minimum of three 'S' passes for any three subjects of the G.C.E. Advanced Level Examination administered by the Department of Examinations of Sri Lanka, in or after 2000

OR

- Those who have obtained a minimum of four ‘S’ passes for any four subjects of the G.C.E. Advanced Level Examination administered by the Department of Examinations of Sri Lanka, before 2000

OR

- Those who have obtained the Certificate of Teacher Training or Diploma in Teaching from a National College of Education (of the National Institute of Education, Ministry of Education, Sri Lanka), with a minimum of 4 Credit passes for the following subjects: Linguistics and Introduction to Phonology, English Language, English Language Teaching Methodology and English Literature

OR

- Those who have obtained a minimum of three passes for any three subjects of the General Certificate of Education Advanced Level Certificate (G.C.E. Advanced Level) of the UK Examination Boards (commonly known as London Advanced Level Examinations: Cambridge/Edexcel)

OR

Those who have obtained a Higher Diploma in English equivalent to the SLQF Level 4 of the Sri Lanka Qualifications Framework of the University Grants Commission, Sri Lanka, on the recommendation from the Department of English and Linguistics, followed by the Senate approval of the University of Sri Jayewardenepura.

## Selection Test Conducted by the Department of English & Linguistics

- It is mandatory for all prospective applicants to pass the Selection Test conducted by the Department of English and Linguistics of the University of Sri Jayewardenepura except for those who have obtained a minimum of an 'S' pass for English (subject number 73 ) from the G. C. E. Advanced Level Examination administered by the Department of Examinations of Sri Lanka.

## ලියාපදිංචියට තෝරා ගැනීම සඳහා අයැදුම් කිරීමේ සුදුසුකම්

- ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව විසින් 2000 වර්ෂයට පෙර පවත්වන ලද අ.පො.ස. (උසස් පෙළ) විභාගයේ විෂයයන් හතරක් සාමාන්‍ය සාමර්ථ්‍ය හතරක් සහිතව සමත් වීම.

හෝ

- ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව විසින් 2000 වර්ෂයේ හෝ ඉන් පසු පවත්වන ලද අ.පො.ස. (උසස් පෙළ) විභාගයේ විෂයයන් තුනක් අවම වශයෙන් සාමාන්‍ය සාමර්ථ්‍ය (S) සහිතව සමත් වීම

හෝ

- පුහුණු ගුරු සහතිකය (ඉංග්‍රීසි භාෂාව, ඉංග්‍රීසි භාෂා ඉගැන්වීමේ ක්‍රම, ඉංග්‍රීසි සාහිත්‍ය, වාග් විද්‍යා හා ශබ්ද විද්‍යා ප්‍රවේශය යන විෂයයන් හතරටම සම්මාන සාමර්ථ්‍ය සහිතව) රජයේ පුහුණු ගුරු සහතිකය ලබා ගෙන තිබීම

හෝ

- එක්සත් රජධානියේ විභාග මණ්ඩල විසින් පවත්වනු ලබන අ.පො.ස. උසස් පෙළ (කේම්බ්‍රිජ්/ එඩෙක්සෙල්) විභාග වලින් ඕනෑම විෂයයන් තුනක් සමත් වී තිබීම (Commonly known as London Advanced Level Examination : Cambridge/Edexel)

හෝ

- ශ්‍රී ලංකා අධ්‍යාපන යෝග්‍යතා රාමුවෙහි 4 වන සාධන මට්ටමට අදාළ උසස් ඉංග්‍රීසි ඩිප්ලෝමාවක් හදාරා තිබීම සහ එම ඩිප්ලෝමාව ඉංග්‍රීසි හා වාග් විද්‍යා අධ්‍යයනාංශයේ නිර්දේශය මත සනාතන සභාවෙන් අනුමත කර තිබීම

**තෝරා ගැනීමේ පරීක්ෂණය**

- සියලුම අයැදුම්කරුවන් ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ ඉංග්‍රීසි හා වාග් විද්‍යා අධ්‍යයනාංශය විසින් පවත්වනු ලබන තෝරා ගැනීමේ පරීක්ෂණයෙන් සමත් විය යුතුය.

- අ.පො.ස. (උසස් පෙළ) විභාගය සඳහා තම ප්‍රධාන විෂයයන් තුනෙන් එකක් ලෙස ඉංග්‍රීසි විෂයය (විෂයය අංක 73) හදාරා අවම වශයෙන් S සාමර්ථ්‍යයක් ලබා ගෙන ඇති අයැදුම්කරුවන් තෝරා ගැනීමේ පරීක්ෂණයට සහභාගී විය යුතු නැත.

## 4. The Programme

This is a three-year undergraduate programme that consists of year-based courses with annual (year-end) examinations and continuous assessments[1]. This programme includes a credit system which correlates with the number of hours the students engage in active learning. The degrees are awarded after the successful completion of the entire three-year programme subject to all the laws and by-laws of the University.

[1] To be decided by the Department of English and Linguistics

## **The Programme Structure**:

The Department offers three main subjects/study fields. These three main subjects carry a total value of 90 credits with an equal distribution within the three academic years (30 credits per year x 3 years). Each main subject consists of two course units (two papers). In addition, one compulsory course (non-credit) will be also offered by the Department in the first year, and this will be Classical Literature. This will consist of one paper and carries two credits, but will not spread over three years. Three other compulsory courses are offered by the Faculty of Humanities and Social Sciences: (1) Introduction to Information Technology, (2) Sri Lankan Society and, (3) Leadership and Personality Development. Each course carries two credits. Introduction to Information Technology is offered in the first year and the other two courses are offered in the second year. The students who are selected for the Bachelor of Arts in English degree programme should enroll for all the above courses.

If a student from any other external degree programme wishes to take some course units from the courses offered for the external degree programme in English, provision is made for such students to select English language courses coming under the course code ELAN. **However, they too should get through the selection test conducted by the Department. A separate selection test will be held for such students.**

## 5. Volume of Learning

- The volume of learning at each level is described in terms of **credits**.
- In the SLQF[2] credit system, the student workload of a study program is defined as 1500 **notional learning hours** per academic year.
- The notional learning hours include direct contact hours with teachers and trainers, time spent in self-learning, preparation for assignments, carrying out assignments and assessments. The need to undertake any or all of these will be considered when a credit is being allocated to a course unit or a module, when the syllabus is designed. It is understood that the combination of learning activities may vary from one course unit or module to another.
- The minimum number of credits per course unit or module is 1. The number of credits per course unit or module should be indicated by whole numbers.
- One credit is considered equivalent to 50 notional learning hours for a taught course, laboratory studies course or field studies/clinical work. (In case of industrial training, including time allocated for assessments and in case of research, including time allocated for literature survey, one credit is considered equivalent to a minimum of 100 notional hours).

---

[2] Sri Lanka Qualifications Frame work 2015

## 6. Course Structure

| Main Subject | Course Code | Course Title | Offering Dept. | Credit Value | Notional Hours | Actual Teaching Hours |
|---|---|---|---|---|---|---|
| (Year 1) English Literature | ELIT 1001: | Introduction to English Literature | Dept. of English | 05 | 250 | 40 |
| | ELIT 1002: | Augustan & Romantic Literature | Dept. of English | 05 | 250 | 40 |
| English Language | ELAN 1001: | Critical Reading & Writing | Dept. of English | 05 | 250 | 40 |
| | ELAN 1002: | Understanding English Grammar | Dept. of English | 05 | 250 | 40 |
| English Language Teaching Methodology | ELTM 1001: | Introduction to ELT | Dept. of English | 05 | 250 | 40 |
| | ELTM 1002: | Approaches & Methods in Second Language Teaching | Dept. of English | 05 | 250 | 40 |
| Classical Literature | CLIT 1005 | Introduction to Classical Literature | Dept. of English | 02 | 100 | 08 |

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| Compulsory Subject | SOSE 1006 | Introduction to Information Technology | Dept. of Social Statistics | 02 | 100 | 08 |
| **Total** | | | | **34** | 1700 | 256 |
| | | | | | | |
| (Year 2) English Literature | ELIT:2001 | Victorian Literature | Dept. of English | 05 | 250 | 40 |
| | ELIT:2002 | Literature from the Medieval to the Metaphysical | Dept. of English | 05 | 250 | 40 |
| English Language | ELAN:2001 | English for Employment | Dept. of English | 05 | 250 | 40 |
| | ELAN:2002 | Linguistics 1: Phonetics/phonology, morphology, and syntax | Dept. of English | 05 | 250 | 40 |
| English Language Teaching Methodology | ELTM:2001 | Teaching Language Skills | Dept. of English | 05 | 250 | 40 |
| | ELTM:2002 | Pedagogical applications | Dept. of English | 05 | 250 | 40 |

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| Compulsory Subject | SOSE 2106 | Sri Lankan Society | Faculty of Humanities and SS | 02 | 100 | 08 |
| Compulsory Subject | SOFT 2107 | Leadership and Personality Development | Faculty of Humanities and SS | 02 | 100 | 08 |
| Total | | | | 34 | 1700 | 256 |
| | | | | | | |
| (Year 3) English Literature | ELIT 3001 | Modern and Postmodern Fiction | Dept. of English | 05 | 250 | 40 |
| | ELIT 3002 | Postcolonial & Sri Lankan Literature | Dept. of English | 05 | 250 | 40 |
| English Language | ELAN 3001 | Linguistics 2: Sociolinguistics, Psycholinguistics, Historical linguistics | Dept. of English | 05 | 250 | 40 |
| | ELAN 3002 | Discourse Analysis | Dept. of English | 05 | 250 | 40 |
| English Language | ELTM 3001 | Testing & Assessment | Dept. of English | 05 | 250 | 40 |

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| Teaching Methodology | ELTM 3002 | ELT Materials Used in Sri Lankan Schools | Dept. of English | 05 | 250 | 40 |
| Total | | | | 30 | 1500 | 240 |

## පාඨමාලා ඒකක සඳහා ලියාපදිංචි වීම සහ වෙනස් කර ගැනීම

### පාඨමාලා ඒකක සඳහා ලියාපදිංචි වීම

ශාස්ත්‍රවේදී (සාමාන්‍ය) බාහිර උපාධි පාඨමාලාව සඳහා ලියාපදිංචි වන සියලුම උපාධි අපේක්ෂකයින් විසින් උපාධියට හදාරනු ලබන ප්‍රධාන විෂය ක්ෂේත්‍ර 3 ක් තෝරාගත යුතුය. මානවශාස්ත්‍ර හා සමාජීය විද්‍යා පීඨයේ අධ්‍යයනාංශ යටතේ ඉදිරිපත් කරනු ලබන ප්‍රධාන විෂය ක්ෂේත්‍ර අතරින් තම අවශ්‍යතා වලට ගැළපෙන පරිදි විෂය ක්ෂේත්‍ර තෝරාගත හැකිය. සමහර විෂය ක්ෂේත්‍ර හැදෑරීම සඳහා පූර්ව අවශ්‍යතා පවතී. එම අවශ්‍යතා සම්පූර්ණ කිරීමට නොහැකි වුවහොත් එම විෂය ක්ෂේත්‍ර සඳහා ලියාපදිංචි වීමට අවසර දෙනු නොලැබේ. එම තෝරාගැනීමේදී උපාධිය නියමිත කාලයේදී අපහසුතාවකින් තොරව සම්පූර්ණ කළ හැකි පරිදි විෂය ක්ෂේත්‍ර තෝරා ගැනීම පිළිබඳව සම්පූර්ණ අවධානය යොමුකළ යුතුය.

### පාඨමාලා ඒකක වෙනස් කරගැනීම

පාඨමාලාවට අදාළ සම්මන්ත්‍රණ ආරම්භ කර මාසයක පමණ කාලයක් තුළ තමන් ලියාපදිංචි වූ විෂය ක්ෂේත්‍රය වෙනස් කරගත හැකිය. එබැවින් එම කාලය තුළ අදාළ විෂය නිර්දේශ ආදිය කියවා බලා දේශකවරුන්ගෙන් අදාළ උපදෙස් ලබාගෙන තමන්ට උපාධිය හැදෑරීමට සුදුසු විෂය ක්ෂේත්‍ර තෝරාගැනීම සිදුකළ යුතුය. සම්මන්ත්‍රණ මාලාවෙහි පළමු දින සම්මන්ත්‍රණය ආරම්භ වී මාසයකින් පසු ලියාපදිංචි වූ විෂය ක්ෂේත්‍රය කිසිදු හේතුවක් නිසා වෙනස් කරනු නොලැබේ.

## පැවරුම්, ඇගයීම් ක්‍රමය සහ ශ්‍රේණි පටිපාටිය

### හැඳින්වීම

පැවරුම් සම්පූර්ණ කිරීමේ ක්‍රියාවලිය, ඇගැයීම් ක්‍රම සහ ශ්‍රේණි තීරණය කිරීම පිළිබඳ කරුණු මෙම කොටසින් ඉදිරිපත් කෙරේ.

### පැවරුම් සම්පූර්ණ කිරීම

පැවරුම් නියමිත වේලාවට අදාළ ආචාර්යවරයාගේ උපදෙස් පරිදි බාහිර උපාධි හා විස්තාරිත පාඨමාලා ඒකකයට හෝ එම ඒකකය විසින් පවරනු ලබන අයෙකුට භාර දීම සම්බන්ධයෙන් වගකීම උපාධි අපේක්ෂකයන් විසින් දැරිය යුතු අතර එසේ භාර දුන් බවට බාහිර උපාධි හා විස්තාරිත පාඨමාලා ඒකකයෙන් ලබාදෙන ලේඛනයේ තමන්ගේ අත්සන යෙදීමෙන් තහවුරු කළ යුතුය. අධ්‍යයනාංශය හෝ පාඨමාලා ඒකකය භාර ආචාර්යවරයා වග කියනු ලබන්නේ එකී නියමිත කාර්යය පටිපාටිය අනුගමනය කර අධ්‍යයනාංශය හෝ බාහිර විභාග අංශය වෙත භාරදෙනු ලබන පැවරුම් සම්බන්ධයෙන් පමණි.

## පාඨමාලා ඒකක ඇගයීම

ඇතැම් පාඨමාලා ඒකකයක ඇගයීම් ක්‍රමය අඛණ්ඩ ඇගයීම් සහ අවසාන පරීක්ෂණය යන කොටස් දෙකෙන් සමන්විත විය හැකිය. **පාඨමාලා ඒකකයක් සම්පූර්ණ කර ශ්‍රේණියක් ලබා ගැනීම සඳහා මෙම කොටස් දෙකම සම්පූර්ණ කිරීම අනිවාර්ය වේ.**

## අඛණ්ඩ ඇගයීම්

අඛණ්ඩ ඇගයීම් ක්‍රමය යටතේ සෑම බාහිර උපාධි අපේක්ෂකයකුම අවසාන පරීක්ෂණයට පෙර යටත් පිරිසෙයින් එක් වරක් වත් අඛණ්ඩ ඇගැයීමකට භාජන විය යුතුය. අඛණ්ඩ ඇගයීම්, මධ්‍ය අර්ධ වාර්ෂික විභාග හෝ පරීක්ෂණ / පැවරුම් / ඉදිරිපත් කිරීම්/වාචික පරීක්ෂණ / ප්‍රායෝගික පරීක්ෂණ / ක්ෂේත්‍ර අධ්‍යයන යන එකකින් හෝ කිහිපයකින් සමන්විත විය හැකිය. කිසියම් පාඨමාලා ඒකකයකට අයත් ඇගයීම් ලබාදීම හෝ ඇගයීම් පටිපාටිය තීරණය කිරීමේ අයිතිය එම ඒකකය භාර ආචාර්යවරයා සතු වෙයි. එහිදී යම් උපාධි අපේක්ෂකයෙක් වර්ෂාවසාන පරීක්ෂණයට පමණක් පෙනීසිට අඛණ්ඩ ඇගයීම සිදු නො කළහොත් එම පාඨමාලා ඒකකය අසමත් ලෙස සලකනු ලැබේ. එක් අඛණ්ඩ ඇගයීමක් සඳහා අවම වශයෙන් ලකුණු 8 ක් හෝ 40% ලබා ඇත්නම් ඉදිරි අවස්ථා දෙකක් සඳහා එම අඛණ්ඩ ඇගයීම් ලකුණු සලකා බලනු ලැබේ.

**අඛණ්ඩ ඇගයීම් සඳහා අවසාන ලකුණුවලින් 20%ට නොඅඩු සහ 40 %ට නොවැඩි ප්‍රතිශතයක් හිමි වේ. එසේ වුවද ඉහත සඳහන් එක් අඛණ්ඩ ඇගයීමක් සඳහා හිමි විය හැකි උපරිම ලකුණු ප්‍රමාණය 20%කි.**

### අවසාන පරීක්ෂණය

සෑම පාඨමාලා ඒකකයක් සඳහාම අධ්‍යයන වර්ෂය අවසානයේදී පරීක්ෂණයක් පවත්වනු ලැබේ. එක් එක් පාඨමාලා ඒකකවල ආවශ්‍යකතාවන්ට අනුව අවසාන පරීක්ෂණවල කාලය වෙනස් විය හැකිය.

සාමාන්‍යයෙන් අවසාන පරීක්ෂණය සඳහා නියමිත ප්‍රශ්න පත්‍රයට හිමි කාලය පැය තුනකි. අවසාන පරීක්ෂණය සඳහා පැවරුම්/ අඛණ්ඩ ඇගයීම් නිර්දේශ කර නොමැති පාඨමාලාවක ප්‍රශ්න පත්‍රය සඳහා ලකුණු 100% ක් හිමි වන අතර, පැවරුම්/ අඛණ්ඩ ඇගයීම් නියම කර ඇති පාඨමාලාවක අදාළ පරිදි 60% - 80%ක් වේ.

## ශ්‍රේණි පටිපාටිය සහ ශ්‍රේණි ලකුණු සාමාන්‍යය (GPA)

බාහිර උපාධි හා විස්තාරිත පාඨමාලා ඒකකයේ ලියාපදිංචි උපාධි අපේක්ෂකයන්ගේ අධ්‍යයන කටයුතු ඇගයීමේදී පහත දැක්වෙන ශ්‍රේණි අක්ෂර සහ සංකේත භාවිත කරනු ලැබේ. ශ්‍රේණි ලකුණු සාමාන්‍යය යනු කිසියම් බාහිර උපාධි අපේක්ෂකයකු තම උපාධි පාඨමාලාව තුළදී සම්පූර්ණ කරන ලද පාඨමාලා ඒකක සඳහා ලබා ගත් ශ්‍රේණිවලට ආරෝපණය කරනු ලබන ලකුණු එම ඒකකයන්ගේ ඒකක අගයෙන් බර තැබීම මගින් ගණනය කරනු ලබන සාමාන්‍ය අගයයි.බාහිර උපාධි හා විස්තාරිත පාඨමාලා ඒකක ඇගයීම් කටයුතුවලදී ලකුණුවලට අනුව ශ්‍රේණි තීරණය කරන ආකාරය සහ ඒ ඒ ශ්‍රේණියට අදාළ ඒකක අගයන් පහත දැක්වෙන පරිදි වේ.

| ලකුණු | ශ්‍රේණි/ සංකේත | ඒකක අගය | විස්තරය |
|---|---|---|---|
| 85 -100 | A+ | 4.00 | විශිෂ්ඨයි |
| 70 - 84 | A | 4.00 | |
| 65 - 69 | A- | 3.70 | හොඳයි |

| | | | |
|---|---|---|---|
| 60 - 64 | B+ | 3.30 | |
| 55 - 59 | B | 3.00 | |
| 50 - 54 | B- | 2.70 | |
| 45 - 49 | C+ | 2.30 | සතුටුදායකයි |
| 40 - 44 | C | 2.00 | |
| 35 - 39 | C- | 1.70 | |
| 30 - 34 | D+ | 1.30 | අසතුටුදායකයි |
| 25 - 29 | D | 1.00 | |
| 0 - 24 | E | 0.00 | |
| - | AB | | නොපැමිණි |
| | EXL | | බැහැර කළ |
| - | DFR | අදාළ නොවේ | කල් දැමු |
| - | MC | | වෛද්‍ය හේතු මත |

**ශ්‍රේණි ලකුණු ගණනය කරන ආකාරය පහත නිදර්ශනය මගින් දැක්වේ.**

නිදර්ශනය :-

| **කේතය** | **පාඨමාලා ඒකකයේ නම** | **ලබා ගත් ශ්‍රේණිය** | **උපයා ගත් ශ්‍රේණි ලකුණු** | **ඒකක අගය** | **උපයා ගත් ශ්‍රේණි ලකුණු වටිනාකම** |
|---|---|---|---|---|---|
| BCGE 1001.5 | භාරතීය බෞද්ධ ශිෂ්ටාචාරයෙහි ප්‍රභවය හා පරිහානිය | **B** | 3.00 | 5 | 15 |
| BCGE 1002.5 | මූලධර්ම අධ්‍යයනය | **B** | 3.00 | 5 | 15 |
| ECGE 1001.5 | සූක්ෂම ආර්ථික විද්‍යා මූලධර්ම | **A+** | 4.00 | 5 | 20 |
| ECGE 1002.5 | සාර්ව ආර්ථික විද්‍යා මූලධර්ම | **A -** | 3.70 | 5 | 18.5 |
| SOGE 1001.5 | සමාජ විද්‍යා මූලික සංකල්ප | **B+** | 3.30 | 5 | 16.5 |
| SOGE 1002.5 | සමකාලීන සමාජය හා සමාජ වෙනස්වීම | **C** | 2.00 | 5 | 10 |
| ENGE 1005.2 | Compulsary English | **C** | 2.00 | 2 | 04 |
| SOSE 1006.2 | තොරතුරු තාක්ෂණය | **C** | 2.00 | 2 | 04 |
| එකතුව | | | | 34 | 103 |

$$GPA = \frac{\sum_{i=1}^{N}\left[(\text{ඒකක අගය})_i * (\text{උපයාගත් ශ්‍රේණි ලකුණ})_i\right]}{N}$$

$$GPA = \frac{\text{උපයා ගත් ශ්‍රේණි ලකුණු වටිනාකම් එකතුව}}{\text{ඒකක අගය එකතුව}} = \frac{103}{34} = 3.029$$

මේ අනුව උපාධියෙහි අවසන් ශ්‍රේණි ලකුණු අගය වන්නේ 3.02 කි.

මෙය සතුටුදායක තත්ත්වයකි.

**අවසන් ශ්‍රේණි ලකුණු ගණනය කළ විට අසමත් ශ්‍රේණි අගයන් දක්වන උදාහරණයක් පහත දැක්වේ**

| **කේතය** | **පාඨමාලා ඒකකයේ නම** | **ලබා ගත් ශ්‍රේණිය** | **උපයා ගත් ශ්‍රේණි ලකුණු** | **ඒකක අගය** | **උපයා ගත් ශ්‍රේණි ලකුණු වටිනාකම** |
|---|---|---|---|---|---|
| BCGE 1001.5 | භාරතීය බෞද්ධ ශිෂ්ටාචාරයෙහි ප්‍රභවය හා පරිහානිය | **C** | 2.00 | 5 | 10 |
| BCGE 1002.5 | මූලධර්ම අධ්‍යයනය | **C** | 2.00 | 5 | 10 |
| ECGE 1001.5 | සූක්ෂම ආර්ථික විද්‍යා මූලධර්ම | **D** | 1.00 | 5 | 5 |
| ECGE 1002.5 | සාර්ව ආර්ථික විද්‍යා මූලධර්ම | **C -** | 1.70 | 5 | 8.5 |

| | | | | | |
|---|---|---|---|---|---|
| SOGE 1001.5 | සමාජ විද්‍යා මූලික සංකල්ප | **C+** | 2.30 | 5 | 11.5 |
| SOGE 1002.5 | සමකාලීන සමාජය හා සමාජ වෙනස්වීම | **C** | 2.00 | 5 | 10 |
| ENGE 1005.2 | Compulsary English | **C** | 2.00 | 2 | 04 |
| SOSE 1006.2 | තොරතුරු තාක්ෂණය | **C** | 2.00 | 2 | 04 |
| එකතුව | | | | 34 | 63 |

$$GPA = \frac{\sum_{i=1}^{N} \left[ (\text{ඒකක අගය})_i * (\text{උපයාගත් ශ්‍රේණි ලකුණ})_i \right]}{\sum_{i=1}^{N} (\text{ඒකක අගය})_i}$$

$$GPA = \frac{\text{උපයා ගත් ශ්‍රේණි ලකුණු වටිනාකම් එකතුව}}{\text{ඒකක අගය එකතුව}} = \frac{63}{34} = 1.85$$

**මෙය අසතුටුදායක තත්ත්වයකි**

**<u>විෂය ප්‍රතිපෝෂක සම්මන්ත්‍රණ</u>**

විශ්වවිද්‍යාලයේ අභ්‍යන්තර සිසුන්ට දේශන පවත්වනු ලබන ආකාරයටම බාහිර විභාග සඳහා ලියාපදිංචි වී ඇති සිසුන්ට ද විශ්වවිද්‍යාලය තුළට කැඳවා විෂය ප්‍රතිපෝෂක සම්මන්ත්‍රණ පවත්වන ලද නමුත් පසුගිය කාලයේ රට තුළ පැවති අයහපත් සෞඛ්‍ය තත්ත්වය නිසා එලෙස සම්මන්ත්‍රණ පැවැත්වීමට නොහැකිවිය. එබැවින් සිසුන් අභිමුඛයෙහි සම්මන්ත්‍රණ පැවැත්වීම වෙනුවට විද්‍යුත් මාධ්‍ය උපයෝගී කරගනිමින් විෂය ප්‍රතිපෝෂක සම්මන්ත්‍රණ පැවැත්වීම සඳහා අවශ්‍ය පියවර ගන්නා ලදී.

ඒ අනුව දැනට විෂය ප්‍රතිපෝෂක සම්මන්ත්‍රණ පහත සඳහන් ආකාරයෙන් පැවැත්වීම සිදු කෙරේ.

1. සම්මන්ත්‍රණ වීඩියෝගත කර විද්‍යුත් ඉගෙනුම් පද්ධතිය හරහා (LMS) සිසුන් වෙත ලබා දීම.
2. සම්මන්ත්‍රණ පවත්වන අවස්ථාවේදීම මාර්ගගත ක්‍රමයට (Online) සිසුන්ට ඊට සහභාගි වීමට අවස්ථාව සලසා දීම.
3. සම්මන්ත්‍රණ ආරම්භක අවස්ථාවේදී සීමිත කණ්ඩායම් විශ්වවිද්‍යාලය තුළට කැඳවා පෙර පරිදි සම්මන්ත්‍රණ පැවැත්වීම.

බාහිර උපාධි හා විස්තාරිත පාඨමාලා ඒකකය මගින් මෙහෙයවනු ලබන බාහිර උපාධි පාඨමාලා වලට අදාල ඒ ඒ විෂයයන්ට නියමිත විෂය ප්‍රතිපෝෂක සම්මන්ත්‍රණ පැවැත්වෙන ආකාරය පිළිබඳ තොරතුරු මෙන්ම සම්මන්ත්‍රණ පැවැත්වෙන දින සහ වේලාව සඳහන් දැන්වීමක් අපගේ වෙබ් අඩවිය මඟින් ප්‍රසිද්ධ කර කල් වේලා ඇතිව සිසුන් දැනුවත් කරනු ලබන අතර තමන්ට කැමති මෙන්ම පහසු ආකාරයකට එම සම්මන්ත්‍රණ වලට සහභාගි වීමට සිසුන්ට අවස්ථාව ලබා දී ඇත. මෙම ප්‍රතිපෝෂක සම්මන්ත්‍රණ වලට සහභාගි වීම අනිවාර්ය වේ.

# විභාග නිර්ණායක (GPA) සහ උපාධි ආවශ්‍යකතා

## විභාග නිර්ණායක

බාහිර උපාධි හා විස්තාරිත පාඨමාලා ඒකකයේ සියලුම බාහිර උපාධි අපේක්ෂකයන් ඔවුන් ලියාපදිංචි වී ඇති පාඨමාලාවට අදාළ ආවශ්‍යකතා සපුරාලිය යුතු අතර සතුටුදායක අධ්‍යයන ප්‍රගතියක්ද පෙන්නුම් කළ යුතු වේ. මේ සඳහා අදාළ වන විභාග නිර්ණායක පහත අංක යටතේ දැක්වේ.

## පාඨමාලා ඒකකයක් සමත් වීම හෝ අසමත් වීම

උපාධි අපේක්ෂකයකු කිසියම් පාඨමාලා ඒකකයකින් C හෝ ඊට ඉහළ ශ්‍රේණියක් ලබා ඇත්නම් එම පාඨමාලා ඒකකයෙන් සමත් ලෙස සැලකෙන අතර D, D+ සහ C- යන ශ්‍රේණි ඌන සාමර්ථ්‍ය ශ්‍රේණි ලෙස සැලකේ.

උපාධි අපේක්ෂකයකු කිසියම් පාඨමාලා ඒකකයක් සඳහා E, AB සහ FAIL ශ්‍රේණිවලින් කිසිවක් ලබා ඇත්නම් එම පාඨමාලා ඒකකය අසමත් යැයි සැලකේ. උපාධි පාඨමාලාවක් සම්පූර්ණ කිරීමට එලෙස අසමත් වන සියලු පාඨමාලා ඒකක සමත් වීම අනිවාර්ය වේ.

## වර්ෂ අවසාන විභාගයට පෙනී නොසිටීම

අවසාන විභාගයට පෙනී නොසිටීමට බලපාන හේතු පහත සංකේතයන්ගෙන් දැක්වේ.

- වෛද්‍ය හේතු මත විභාගයට පෙනී නොසිටීම MC
- පිළිගත හැකි හේතු මත විභාගයට පෙනී නොසිට කල් ගැනීම DFR

- පිළිගත හැකි හේතුවක් නොමැතිව විභාගයට පෙනී නොසිටීම AB (මෙම තත්ත්වය පාඨමාලා ඒකකය අසමත් වීමක් ලෙස සලකනු ලැබේ.)
- පාඨමාලාවෙන් බැහැර කළ අවස්ථාවේදී EXL

## විභාගයට පෙනී නොසිටීම සඳහා පිළිගත් හේතු

උපාධි අපේක්‍ෂකයා බරපතළ ලෙස රෝගාතුර වීම, පවුලේ ළඟම සාමාජිකයෙකුගේ අභාවය හෝ සනාතන සභාව විසින් අනුමත කරනු ලබන වෙනත් හේතුවක් පිළිගත හැකි හේතුවක් වේ. රෝගී තත්ත්වයකදී අදාළ ප්‍රශ්න පත්‍රය සඳහා විභාගය පැවැත්වෙන දින සිට දින 14ක් ඇතුළතදී විශ්වවිද්‍යාලයීය වෛද්‍ය නිලධාරියා විසින් අනුමත කරන ලද වෛද්‍ය සහතිකයක් බාහිර උපාධි හා විස්තාරිත පාඨමාලා ඒකකයට ඉදිරිපත් කළ යුතුය.

වෛද්‍ය සහතිකය ලබා ගෙන ඇත්තේ රජයේ වෛද්‍ය සභාවේ ලියාපදිංචි වී ඇති පෞද්ගලික අංශයේ සේවයේ නියුතු වෛද්‍යවරයකුගෙන් නම් එය විශ්වවිද්‍යාලයේ වෛද්‍ය නිලධාරියකු මගින් සහතික කරවා ගත යුතු අතර වෛද්‍ය සහතිකය ලබා ගෙන ඇත්තේ ආයුර්වේද වෛද්‍යවරයකුගෙන් නම් එය රජයේ ආයුර්වේද රෝහලක වෛද්‍ය නිලධාරියකු මගින් සහතික කරවා ගත යුතුය. මෙම වෛද්‍ය සහතික මානවශාස්ත්‍ර හා සමාජීයවිද්‍යා අධ්‍යයන මණ්ඩල නිර්දේශිතව සහ සනාතන සභාව විසින් අනුමත කළ යුතුය.

වෛද්‍ය සහතිකය පිළිගත හැකි එකක් නම් පාඨමාලා ඒකකය සඳහා උපාධි අපේක්ෂකයාට MC සංකේතය ලැබේ. මෙය පළමුවර පෙනී සිටීමක් ලෙස සලකා නැවත අදාළ පාඨමාලා ඒකකය සඳහා විභාගයට පෙනී සිටීමට සුදුසුකමක් වේ.

කෙසේ වුවද නැවත විභාගයට පෙනී සිටීමේදී පාඨමාලා ඒකකයට අදාළ සියලුම ඇගයීම් සම්පූර්ණ කළ යුතුය.

පවුලේ ළඟම සාමාජිකයෙකුගේ අභාවයකදී නිසි පරිදි සහතික කළ මරණ සහතිකයක් ඥාතිත්වය තහවුරු කිරීමේ සහතික සමග බාහිර උපාධි හා විස්තාරිත පාඨමාලා ඒකකය වෙත ඉදිරිපත් කළ යුතුය. අවමංගල්‍ය ශෝක ප්‍රකාශ මරණ සහතික ලෙස පිළිගනු නොලැබේ.

## පාඨමාලා ඒකක සඳහා පුනර් පරීක්ෂණ

බාහිර උපාධි හා විස්තාරිත පාඨමාලා පීඨ අධ්‍යයන කමිටුවේ සහ පීඨ මණ්ඩලයේ නිර්දේශිතව සහ සනාතන සභාව අනුමත කරනු ලබන විශේෂ තත්ත්වයකදී හැර E ශ්‍රේණියක් සහිතව පාඨමාලා ඒකකයකට පෙනී සිටින උපාධි අපේක්ෂකයන් එම ඒකකය නැවත ඉදිරිපත් කරනු ලබන ප්‍රථම අවස්ථාවේදීම එයට පෙනී සිටිය යුතුය. උපාධි අපේක්ෂකයකු D, D+, C- යන ශ්‍රේණි ලබා සිටින විට එම පාඨමාලාව සඳහා විභාගය නැවත පැවැත්වෙන ප්‍රථම අවස්ථාවේදී එම පාඨමාලාව සඳහාම ලියාපදිංචි වී නැවත පෙනී සිටිය හැකිය. පාඨමාලා ඒකකයකින් අසමත්ව නැවත පෙනී සිටින අපේක්ෂකයකුට ලබා ගත හැකි උපරිම ශ්‍රේණිය C වේ. පුනර් පරීක්ෂණයකදී කලින් ලබා ගත් ශ්‍රේණියට වඩා අඩු ශ්‍රේණියක් ලබා ගෙන ඇති අවස්ථාවකදී කලින් ලබා ගෙන ඇති ඉහළම ශ්‍රේණිය උපාධි අපේක්ෂකයාට හිමි වේ.

## අඛණ්ඩ ඇගයීම් සඳහා පුනර් පරීක්ෂණ

පිළිගත හැකි හේතුවක් මත අඛණ්ඩ ඇගයීම සම්පූර්ණ කර නොමැති බාහිර උපාධි අපේක්ෂකයකු අදාළ ආචාර්යවරයා විසින් බාහිර උපාධි හා විස්තාරිත පාඨමාලා ඒකකය වෙත ලබාදී ඇති උපදෙස් පරිදි ඔහුගේ අධීක්ෂණය යටතේ ඊළඟ වර්ෂයේදී අඛණ්ඩ ඇගයීම් සම්පූර්ණ කළ හැකිය.

### වර්ෂ අවසාන විභාගය සඳහා පුනර් පරීක්ෂණ

සනාතන සභාව විසින් නියම කරනු ලබන අවස්ථාවකදී හැර වර්ෂ අවසාන පුනර් පරීක්ෂණයක් එම වර්ෂය තුළදීම නොපැවැත්වේ. වර්ෂ අවසාන පරීක්ෂණයට නැවත පෙනී සිටින උපාධි අපේක්ෂකයකු නැවත එම විභාගය පැවැත්වෙන ප්‍රථම අවස්ථාවේදීම ඒ සඳහා පෙනී සිටිය යුතුය.

පාඨමාලා ඒකකයක් සඳහා නැවත පෙනී සිටීමේදී එම පාඨමාලා ඒකකය සඳහා අලුතෙන් ලියාපදිංචි වී අඛණ්ඩ ඇගයීම් සහ අවසාන පරීක්ෂණය යන කොටස් දෙකම සම්පූර්ණ කළ යුතුය. කලින් අවස්ථාවල අඛණ්ඩ ඇගයීම් සඳහා ඊට වෙන් කරන ලද ලකුණුවලින් 40%ක් ලබා ගෙන ඇති අවස්ථාවකදී පමණක් එම ලබා ගත් ලකුණු පාඨමාලා ඒකකයට නැවත පෙනී සිටීමේදී සැලකිල්ලට ගනු ලැබේ.

වලංගු හේතු සනාතන සභාව විසින් පිළිගන්නා අවස්ථාවකදී බාහිර උපාධි අපේක්ෂකයකු විභාගයට පෙනී සිට ලබාගන්නා ලකුණු හෝ ශ්‍රේණි සඳහා සීමාවන් පනවන්නේ නැත (නිදර්ශනය: MC).

## උපාධි ආවශ්‍යකතා

ශාස්ත්‍රවේදී සාමාන්‍ය බාහිර උපාධි සාමර්ථ්‍යය ලබා ගැනීම සඳහා උපාධි අපේක්ෂකයන් විසින් සම්පූර්ණ කළ යුතු ආවශ්‍යකතා මෙම කොටසින් විස්තර කෙරේ.

### ශාස්ත්‍රවේදී (සාමාන්‍ය) බාහිර උපාධි ආවශ්‍යකතා

ශාස්ත්‍රවේදී (සාමාන්‍ය) බාහිර උපාධිය ලබා ගැනීම සඳහා පහත සඳහන් ආවශ්‍යකතා සම්පූර්ණ කළ යුතුය.

- අවම වශයෙන් ඒකක අගය **98**ක් වන පරිදි පාඨමාලා ඒකක සංඛ්‍යාවක් සම්පූර්ණ කළ යුතුය.
- සමස්ත උපාධි පාඨමාලාව සඳහා **2.00**ට නොඅඩු ශ්‍රේණි ලකුණු සාමාන්‍යයක් (GPA) තිබිය යුතුය.
- අසමත් ශ්‍රේණිය (E) සහ විභාගයට පෙනී නොසිටීමේ සංකේතය (ABS) නොතිබිය යුතුය.

## පන්ති සාමර්ථ්‍යය ප්‍රදානය

ශාස්ත්‍රවේදී (සාමාන්‍ය) බාහිර උපාධි පාඨමාලා සඳහා පන්ති සාමර්ථ්‍ය ලැබීමේ ආවශ්‍යකතා පහත දැක්වේ.

### පළමු පෙළ පන්ති සාමර්ථ්‍යය

පළමු පෙළ පන්ති සාමර්ථ්‍යයක් ප්‍රදානය සඳහාඃ

- මානව ශාස්ත්‍ර හා සමාජීය විද්‍යා පීඨයේ සහ සනාතන සභාවේ අනුමැතියට යටත්ව පිළිගත හැකි වලංගු හේතුවක් ඇති අවස්ථාවකදී හැර පළමුවෙන් ලියාපදිංචි වූ වර්ෂයේ සිට ශාස්ත්‍රවේදී සාමාන්‍ය බාහිර උපාධියේදී වර්ෂ තුනක් ඇතුළත උපාධි පාඨමාලාව සම්පූර්ණ කළ යුතුය.
- සමස්ත උපාධි පාඨමාලාව සඳහා **3.70**ට නොඅඩු ශ්‍රේණි ලකුණු සාමාන්‍යයක් (GPA) ලබා ගත යුතුය.
- අසමත් ශ්‍රේණිය (E) සහ විභාගයට පෙනී නොසිටීමේ සංකේතය (AB) නොතිබිය යුතුය.
- සමස්ත උපාධි පාඨමාලාව සඳහා C ශ්‍රේණියට පහළ ශ්‍රේණි නොතිබිය යුතු අතර සමස්ත උපාධි පාඨමාලාවේ ඒකක අගයෙන් **50%** ක් A සාමර්ථ්‍ය වලින් උපයා ගත යුතුය.

## දෙවන පෙළ (ඉහළ) පන්ති සාමර්ථ්‍යය

දෙවන පෙළ (ඉහළ) පන්ති සාමර්ථ්‍යයක් ප්‍රදානය සඳහා:

- සනාතන සභා අනුමැතියට යටත්ව පිළිගත හැකි වලංගු හේතුවක් ඇති අවස්ථාවක දී හැර පළමුවෙන් ලියාපදිංචි වූ වර්ෂයේ සිට ශාස්ත්‍රවේදී සාමාන්‍ය බාහිර උපාධියේදී වර්ෂ තුනක් ඇතුළත උපාධි පාඨමාලාව සම්පූර්ණ කළ යුතුය.
- සමස්ත උපාධි පාඨමාලාව සඳහා **3.30**ට නොඅඩු ශ්‍රේණි ලකුණු සාමාන්‍යයක් ලබා ගත යුතුය.
- අසමත් ශ්‍රේණිය (E) සහ විභාගයට පෙනී නොසිටීමේ සංකේතය (AB) නොතිබිය යුතුය.

## දෙවන පෙළ (පහළ) පන්ති සාමර්ථ්‍යය

දෙවන පෙළ (පහළ) පන්ති සාමර්ථ්‍යයක් ප්‍රදානය කිරීම සඳහා:

- සනාතන සභා අනුමැතියට යටත්ව පිළිගත හැකි වලංගු හේතුවක් ඇති අවස්ථාවකදී හැර පළමුවෙන් ලියාපදිංචි වූ වර්ෂයේ සිට ශාස්ත්‍රවේදී සාමාන්‍ය බාහිර උපාධියේදී වර්ෂ තුනක් ඇතුළත උපාධි පාඨමාලාව සම්පූර්ණ කළ යුතුය.
- සමස්ත උපාධි පාඨමාලාව සඳහා **3.00**ට නොඅඩු ශ්‍රේණි ලකුණු සාමාන්‍යයක් ලබා ගත යුතුය.
- අසමත් ශ්‍රේණිය (E) සහ විභාගයට පෙනී නොසිටීමේ සංකේතය (AB) නොතිබිය යුතුය.

## සාමාන්‍ය සාමර්ථ්‍යය

සාමාන්‍ය සාමර්ථ්‍යයක් ප්‍රදානය සඳහා:

- සමස්ත උපාධි පාඨමාලාව සඳහා **2.00**ට නොඅඩු ශ්‍රේණි ලකුණු සාමාන්‍යයක් (GPA) තිබිය යුතුය.

- අසමත් ශ්‍රේණිය (E) සහ විභාගයට පෙනී නොසිටීමේ සංකේතය (ABS) නොතිබිය යුතුය.

## පිළිතුරු පත්‍ර නැවත සමීක්ෂණය

පිළිතුරු පත්‍ර නැවත සමීක්ෂණය සඳහා කැමැත්තක් දක්වන සිසුන් විභාග ප්‍රතිඵල නිකුත් කර දින **14**ක් ඇතුළත ඒ සඳහා ඉල්ලුම් කළ යුතුය. බාහිර විභාග අංශයට පැමිණ මේ සඳහා අයදුම් කළ හැකිය

## විභාග අක්‍රමිකතා

බාහිර විභාග සඳහා පෙනී සිටින අපේක්ෂකයන් වෙත අභ්‍යන්තර සිසුන්ට අදාළ විභාග අක්‍රමිකතා පිළිබඳව පවතින විනය පටිපාටියම ක්‍රියාත්මක වේ. විභාග ශාලාව තුළ විනය පවත්වාගෙන යාම සඳහා සෑම අපේක්ෂකයකුම සහාය විය යුතු වේ. පහත දක්වා ඇති විභාග අක්‍රමිකතා සිදුකිරීම බලවත් වරදක් වන අතර එවැනි විෂමාචාර ක්‍රියාවක යෙදුණහොත් විශ්වවිද්‍යාල සනාතන සභාව විසින් පනවා ඇති දඬුවම්වලට අපේක්ෂකයන් යටත්වනු ඇත.

### විභාග අක්‍රමිකතා ලෙස සැලකෙන කරුණු

- සෙලියුලර් දූරකථන හෝ වෙනත් සන්නිවේදන උපකරණ, ආදිය විභාග ශාලා තුළ තමන් ළඟ තබා ගැනීම, භාවිත කිරීම.
- ලිපිලේඛන සහ බල නොලත් වෙනත් ලේඛන සන්තකයේ තබා ගැනීම.
- විභාග ශාලාවේ දී විශ්වවිද්‍යාලය මගින් සපයනු ලබන ලිපි ද්‍රව්‍ය හා ලේඛන ආදිය විභාග ශාලාවෙන් පිටතට ගෙන යාම.
- පිළිතුරු ලිවීම සඳහා වෙනත් අයගෙන් උදව් ලබා ගැනීම.
- විභාග අපේක්ෂකයකු තමන් වෙනුවෙන් විභාගයට පෙනී සිටීමට වෙනත් කෙනෙකු යෙදවීම.
- ප්‍රශ්න පත්‍රයක ඇතුළත් දෑ අයථා පරිදි දැන ගැනීමට තැත් කිරීම.

- විභාග සම්බන්ධ යම් වරදක් කිරීමට ආධාර අනුබල ලබාදීම හා ලබා ගැනීම.
- විභාග ශාලාධිපතිට, නිරීක්ෂකවරුන්ට හෝ අනෙකුත් විභාග නිලධාරීන්ට බලපෑම් කිරීම.
- අසංවර හැසිරීම්, අනිසි බලපෑම් හා වෙනත් වංචනික ක්‍රියා සිදු කිරීම.
- ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ සනාතන සභාව විසින් විභාග අක්‍රමිකතාවක් ලෙස සැලකෙන වෙනත් ඕනෑම විභාග වංචනික ක්‍රියාවක් සිදු කිරීම.

### විභාග අක්‍රමිකතා සඳහා ක්‍රියාත්මක දඬුවම්

- විභාග අපේක්ෂකත්වය අවලංගු කිරීම.
- ලියාපදිංචිය අත්හිටුවීම/අවලංගු කිරීම.
- දඩයක් සහිතව හෝ රහිතව කිසියම් කාල සීමාවකට යටත්ව විභාගයකට පෙනී සිටීම තහනම් කිරීම.
- පන්ති සාමර්ථ්‍යයක් නො දීම.
- අවලංගු කළ ප්‍රශ්න පත්‍රවලට නැවත පෙනී සිටීමේදී ලකුණු 40 ක උපරිමයකට සීමා කිරීම
- උපාධි ප්‍රදානෝත්සවයට සහභාගි කරවා නොගැනීම.
- උපාධි ප්‍රදානය හා ප්‍රතිඵල නිකුත්කිරීම වර්ෂයකින් ප්‍රමාද කිරීම.
- විශ්වවිද්‍යාල සනාතන සභාව මගින් නියම කරනු ලැබිය හැකි වෙනත් දඬුවම් ආදිය වේ.

## උපාධිය වලංගු වන දිනය

සාමාන්‍ය බාහිර උපාධි පාඨමාලාවක උපාධිය සඳහා වලංගු දිනය වන්නේ තුන්වන අධ්‍යයන වර්ෂයේ විභාග කාල පරිච්ඡේදයේ අවසන් දිනයට පසු දිනය වේ.

## උපාධි ප්‍රදානෝත්සවය

ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය වාර්ෂිකව පවත්වනු ලබන බාහිර උපාධි ප්‍රදානෝත්සවයේ දී ඒ වනවිට සාර්ථක ලෙස සිය උපාධි ආවශ්‍යකතා සම්පූර්ණ කළ ශිෂ්‍ය ශිෂ්‍යාවන්ට උපාධි ප්‍රදානය කරනු ලැබේ. උපාධි ප්‍රතිඵල නිකුත් කිරීමෙන් අනතුරුව සනාතන සභා අනුමැතියට යටත්ව, සමත්වූ ශිෂ්‍ය ශිෂ්‍යාවන් සඳහා තාවකාලික සහතික පත්‍රයක් නිකුත් කරනු ලැබේ. උපාධි ප්‍රදානෝත්සවයට ඉල්ලුම් කිරීම හා විධිමත් උපාධි සහතිකයට අදාළ ඉල්ලුම් පත්‍ර තැපැල් මගින් එවනු ලැබේ. වාර්ෂිකව පැවැත්වෙන උපාධි ප්‍රදානෝත්සවයේදී අදාළ අයදුම්කරුට විශ්වවිද්‍යාලයේ කුලපති අතින් උපාධිය ප්‍රදානය කෙරේ. යම් අයැදුම්කරුවකුට උපාධි ප්‍රදානෝත්සවයේ දී අභිමුඛයේ හෝ අනභිමුඛයේ උපාධි ලබාගත හැකිය. කෙසේ වුවද, උපාධි ප්‍රදානෝත්සවය සඳහා කැඳවනු ලබන්නේ අයැදුම් කළහොත් පමණි. විභාග අක්‍රමිකතා යටතේ දඬුවම් ලැබූවන් උපාධි ප්‍රදානෝත්සවය සඳහා කැඳවනු නො ලැබේ. උපාධි ප්‍රදානෝත්සවයේ දී ප්‍රදානය කරනු ලබන මුල් සහතිකයේ පිටපත් හෝ අනුපිටපත් නැවත නිකුත් කරනු නො ලැබේ. උපාධි ප්‍රදානෝත්සවය සඳහා අභිමුඛයේ හෝ අනභිමුඛයේ ඉදිරිපත්වන උපාධිලාභීන් සඳහා උපාධි ලෝගුව සහ සාටකය නැවත විශ්වවිද්‍යාලයට භාර දී ඒ බව වාර්තා පොතේ සටහන් කරවා ගතයුතු අතර සහතිකය ලබා ගැනීම සඳහා එය ඉදිරිපත් කළ යුතුය.

### බාහිර උපාධි අපේක්ෂකයන්ගේ විශේෂ අවධානය පිණිසයි.

1. බාහිර උපාධි පාඨමාලා සඳහා දේශන පවත්වන ආයතනයක, ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ ආචාර්යවරයෙකු  සේවය කරන්නේ නම්, ඔහු හෝ ඇය ප්‍රශ්න පත්‍ර සකස් කිරීමට, පිළිතුරු

පත්‍ර පරීක්ෂා කිරීමට හෝ කිසිදු විභාග පරීක්ෂණ කටයුත්තක් සඳහා සහභාගි කරගනු නො ලැබේ.

2. විශ්වවිද්‍යාලයේ අධීක්ෂණය යටතේ අධ්‍යයනාංශ ප්‍රධානවරුන්ගේ හා පීඨාධිපතිතුමාගේ නිර්දේශයන් හා අධ්‍යයන මණ්ඩලයේ හා පීඨමණ්ඩලයේ අනුමැතිය මත පමණක් දේශන, ප්‍රායෝගික ක්‍රියාකාරකම් හා විෂය ප්‍රතිපෝෂක සම්මන්ත්‍රණ පැවැත්වීමට හැකිය.
3. මෙම අත්පොතේ සඳහන් ඕනෑම කරුණක් පූර්ව දැනුම් දීමකින් තොරව සංශෝධනය කිරීමේ අයිතිය ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය සතු වේ.
4. මෙම ශිෂ්‍ය අත්පොතේ සඳහන් කරුණු හොඳින් කියවා තේරුම් ගත යුතු අතර, අදාළ උපාධි පාඨමාලාව හදාරා අවසන් වනතුරු මෙම අත්පොත සුරැකිව තබාගෙන ඊට අනුව කටයුතු කරන ලෙස ද උපදෙස් දෙනු ලැබේ.

| | |
|---|---|
| දු.ක. | : 011 2801481/ 011 3132496 |
| ෆැක්ස් | : 011 2802753 |
| වෙබ් අඩවිය | : external.sjp.ac.lk |
| ඊ මේල් | : ex.certi@sjp.ac.lk |
| විද්‍යුත් ඉගෙනුම් පද්ධතිය | : learnext.sjp.ac.lk |

**ජ්‍යෙෂ්ඨ සහකාර ලේඛකාධිකාරී,**

**බාහිර උපාධි සහ විස්තාරිත පාඨමාලා ඒකකය,**

**ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය,**

**ගංගොඩවිල, නුගේගොඩ.**